# නර්තනය විෂයය හා බැදි වෘත්තික ප්‍රවේශයන්ට අත්වැලක්







යූ.කේ.මහීපාල
උක්වත්ත.

## පිදුම

පෙරයම් දවසක මා ලැබු මගෙ පිං හින්දා

මගෙ මව් පියො දෙදෙනාමත් මට දෙව් හින්දා

පිං ඇති ගුරුතුමණ්ලාව මං හැදු හින්දා

සත්තයි මේ පොත පුදන්නේ ඒ හැම බන්දා

මොනයම් කරදර ආවත් මගේ හිතට වැදී

මගෙ ප්‍රියවුන් ලග හිටියා අතැර නොව රැදී

පියවර තබමින් ඉදිරිය නොයන් මග රැදී

දුන් එවදන් හැමදෙනාට මෙම කෘතිය පිදී



# පටුන

පිටු අංකය


| | |
|---|---|
| පොත ගැන හැදින්වීමක් | 3 - 4 |
| කෘතියෙහි ඇති වැදගත්කම | 5 - 6 |
| නර්තන විෂයයෙහි ගුනාත්මක සංවර්ධනය | 7 – 8 |
| මංගල පෝරු  චාරිත්‍ර | 9- 43 |
| හිස වෙස් බැඳීමේ මංගල්‍යය | 44 - 65 |
| තම්මැට්ටම් කඩිප්පු නිර්මාණය | 66 -71 |
| දවුල් කඩිප්පු නිර්මාණය | 72 -76 |
| වෙස් මුහුණු නිර්මාණය | 73 -76 |

# පොත ගැන හැඳින්වීමක්.

ජාතියක අනන්‍යතාවය ලොවට හඬනගා කිව හැකි යෝග්‍යතම මාධ්‍ය වනුයේ එම රටෙහි ජාතියෙහි සතු සංස්කෘතිකාංගයි. ලාංකීය අප සතු නර්තන කලාව ඒ හා බැඳුණු චාරිත්‍ර වාරිත්‍ර, සැරසිලි, රංග වස්ත්‍ර , වාදන ගායන, ගති පැවතුම්, සිරිත් විරිත්, ලොවට අපේ කම කියාපායි. එවැනි සංස්කෘතික අංග සමාජයේ බොහොමයක් පැවතිය ද වර්ථමානයේ එහි පවතින තත්වය විවිධාකාර වන අතර, කාලයෙන් කාලයට වෙනස් වීම් වලට ද භාජනය වී ඇත.

වසර ගණනාවක් තිස්සේ පරපුරෙන් පරපුරට පැවති නර්තන කලාව බැඳි ඇතැම් විෂයීය අන්තර්ගතයන් විෂයය නිර්දේශවලට ඇතුළත් කර ඇත. ඒ තරමක් හෝ දුරට ශ්‍රී ලංකික සංස්කෘතිය රැක ගැනීමට ගත් ප්‍රතිකර්මයක් වශයෙනි. වර්ථමානයෙහි පාසල් අධ්‍යාපනය තුළ සැළකිය යුතු ස්ථානයක් නර්තන විෂයට හිමිවී ඇත. දැනට ජාතික උරුමය ආරක්ෂා කරන ප්‍රධානතම විෂයය වන්නේද නර්තන කලාවයි. අධ්‍යාපනයෙන් හෙම්බත් වන දරුවන්ට කිසියම් හෝ අස්වැසිල්ලක් ලබා දීම,රස වින්දන ශක්තිය දියුණු කිරීම නර්තන අධ්‍යාපනයෙහි මුඛ්‍ය පරමාර්ථයයි. පුද්ගලයා තුළ උසස් රස වින්දන ශක්තීන් වර්ධනය වීම තුළින් සහකම්පනය, ආදරය, කරුණාව,සහජීවනය වැනි උතුම් මානුෂික ගුණාංග වර්ධනය වනු ඇත.

ශ්‍රී ලාංකික මානවායා තම රටේ අනන්‍යතාවය අනුව ජීවත් වීමට අතීත පරම්පරාවලින් ලබා දුන් දායාදයන් බොහොමයකි. පරම් පරාවෙන් පරාවට දායද කළ අපේම සංස්කෘතික අංගයක් ලෙස නර්තන කලාව ඉතා වැදගත් වන්නේය .ලෝකය හමුවේ අපේම කිව හැකි උරුමයන් අතර නර්තන කලාව අන් කලාවන් හා සසඳා බලන විට මානව සමාජයේ යහපත් පැවැත්මට සෘජුවම බලපා ඇති බව පෙනේ. ගුරු ගෙදර අධ්‍යාපනයෙන් ලබා ගත් අත්දැකීම, ගති පැවතුම්, සිරිත් විරිත්,ආකල්ප,යහපත් මානවයකු බිහි කිරීමට මහත් පිටි වහලක් වී ඇත.

නර්තන කලාව සෘජු අත්දැකීම් ලබා දෙන කලාවකි. ගුරුවරයා ලබාදෙන සියළුම අත්දැකීම් යහපත් මානවයකු සැදීමේ අරමුණු හා බැඳී පවතී. පවුල සහ සමාජය යහමගට ගෙන යා හැකි අපූරු අත්දැකීම් පරම්පරාගතව බැඳී පැවතිණ. හොද - නරක, පිණ - පව් ආදී සියළුම දේ ගුරුවරයා විසින් තම ශිෂ්‍යයාට අත්දැකීම් ලබා ද ඇත.

පොත පතට සීමා නොවුණ එකී අධ්‍යාපනය තුළ මුඛ්‍ය පරමාර්ථයක් වූයේ හොද මිනිසෙක් සමාජයට දායාද කිරීමය. ඒ අනුව නර්තනය හුදෙක්ම ශරීරය චලනය

කරන කලාවක් නොවූ අතර, මානවයාගේ ආකල්ප , කුසලතා, ආවේදන ශක්තීන් වලින් පරිපූර්ණත්වයට පත් කරන්නක් විය.

නර්තන කලාව හා බැදි සංස්කෘතිමය හර පද්ධතීන් බොහොමයක් වර්ථමානයේ ගිලිහී යන බව පෙනේ .මිල මුදල පසුපස, ආර්ථිකමය වාසි සොයා ගමන් කරන මිනිසා නර්තන කලාව හා බැදි උත්තරීතර සිරිත් විරිත් බොහොමයක් දැන හෝ නොදැන අත්හැර ඇත. එබැවින් මෙම කෘතිය නර්තන විෂයය උගන්වන ගුරු භවතුන්ටත්, නර්තනයට ආදරය කරන දුවා දරුවන්ටත්, පමණක් නොව වෘත්තිමය ප්‍රවේශයක් සොයන කවෙරෙකුට වුවද වැදගත් වනු ඇත.

මෙම කෘතියෙන් මංගල පෝරුව හා බැදි චාරිත්‍ර වාරිත්‍ර පිළිබදව සටහන් තබා ඇත. විශේෂයෙන්ම පෝරු චාරිත්‍ර වලට අදාල ඒ ඒ අවස්ථාවන්හි දී කියන්නාවූ වදන් සහ විස්තර කිරීම් ශිල්පියාගේ කථිකත්වය මත රදා පවතී. එහෙත් චාරිත්‍ර වලට අදාලව ඇති ගායනා නොදන්නා අවස්ථාද එමටය. මනමාල යුවල පෝරුවට නැංවීමට පෙර පූර්ව සුදානම් ගායනාද, පොරු මස්තකයෙහි නැංගවීමේ සිට බැස්සවීම දක්වා අදාල ගායනා ද මෙහි ඇතුලත් කර ඇත.

හිස වෙස් බැදීම හා සම්බන්ධ චාරිත්‍ර වාරිත්‍ර පිළිවෙල ද, කළයුතු දෙවල් සහ නොකළ යුතු දේ පිළිබදව ද කරුණු විස්තර කර ඇත.

තම්මැට්ටම් කඩිප්පුවක් නිර්මාණය සදහා ස්වයං අධ්‍යයනයට සදහා අත්වැලක් මෙමගින් සපයා ඇත.

ඒ සදහා යොදාගනු ලබන අමුද්‍රව්‍ය අදියරෙන් අදියර විස්තර කිරීමත්, එකී නිර්මාණය කරන පිළිවෙලත් මෙම කෘතියෙහ් අන්තර්ගතයෙ සදහන් කර ඇත..

වෙස් මුහුණක් නිර්මාණය සදහා ස්වං අත්හදාබැලීමක් කිරීමට මෙමගින් මාර්ගයක් පෙන්වා දෙනු ලබයි. මෙම පොත වෘත්තියක් හෝ විනෝදාංශය සදහා ප්‍රායෝගිකව අත්හදා බැලීමට මාර්ගෝපදේශයක් ද වන්නේය.

අත්දැකීම් තුළින් ජීවිතය සකස් කර ගැනීමට උත්සාහ ගන්නා කවෙරෙකුට වුවද , නිර්මාණශීලිව තමා කෙරෙහි විශ්වාසයක් තුළින් ජීවිතය සාර්ථක කරගන්නෙකුට ද, තමා ගේ අත්දැකීම් තුළින්ම සතුටක් ලබාගන්නෙකුට වුව ද මෙම පොත කදිම අත්වැලක් සපයනු ඇත.

## මෙම කෘතියෙහි වැදගත්කම.......

පාසල් විෂයය මාලාව තුළ නර්තන විෂයට අදාල පොත පත් බොහොමයක් රචනා වී ඇත. වර්ථමානයේ සමාජ කථිකාවන් අතර සෑම විෂයකටම අදාල වෘත්තික ප්‍රවේශයක් තිබිය යුතු යන්න පැහැදිලිය. ජීවත්වීම සඳහා බොහෝ දෙනා විවිධ වෘත්තීන් තෝරා ගනී. ඒ අනුව වර්ථමානයේ තරුණ පරපුර පෝරුව චාරිත්‍ර කිරීම තෝරාගෙන ඇත. සමහරෙක් විනෝදාංශයක් වශයෙන් පෝරු චාරිත්‍ර සිදු කරනු ලබයි. පාසල් පද්ධතිය සහ සංස්කෘතික ආයතන වල නර්තනය ඉගෙන ගැනීමට ඉඩ පහසුකම් ඇතත් මෙවැනි අවශ්‍යතා සඳහා මේ වන විට කිසිදු ආයතනයක් ඒ සඳහා ඉදිරිපත් වී නැත. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් වාර්ෂිකව පවත්වන 2022 සමස්ත ලංකා පාසල් නර්තන තරගාවලියේ වෘත්තික ප්‍රවේශ සඳහා තරග අංග කීපයක් ඉදිරිපත් කිරීම කාගෙත් පැසසුමට හේතුවක් විය . ඒ සඳහා සිසුන් කැමැත්තක් දැක් වුවත්, ඒවා පුරුදු පුහුණු වීමට මාර්ගයක් සොයා ගිය බවත්, ඇතැම් සිසුන් මේ පිළිබඳව කරුණු සොයා යෑමේ දී ශිල්පීන් තම ශිල්පය නොදුන් බවත් සත්‍ය කරුණක් වන්නේය. දරුවන්ගේ කැමැත්තෙන්ම සිදු කළ හැකි මෙම සංස්කෘතිමය චාරිත්‍ර සඳහා අත්වැලක් සැපයීමට හැකිවීම සතුටට කරුණකි. එබැවින් ගුරුභවතුන්ට සහ සිසුන් සඳහා මෙම පොත ඉතා වැදගත් වනු ඇත. මෙහි ඇතුළත් කරුණු සියල්ලම මා විසින් ගුරු පරපුරවල් සහ පෝරු චාරිත්‍ර ශිල්පීන් හමුවී සොයාගත් කරුණු බව කිව යුතුමය. ඒ සඳහා විවිධ ප්‍රදේශ වල අධ්‍යයනය කිරීමට සිදු විය. මෙම කෘතියෙහි භාෂාව සරල තේරෙන බසින් ලියා ඇත්තේ බොහෝ කෘතිවල අන්තර්ගතය සෑමටම තේරුම් ගත නොහැකි වීම පිළිබඳ අත්දැකීමය.

මෙම කෘතියෙහි මංගල පෝරු චාරිත්‍රවලට අදාල පූර්ව සූදානම සිට අවසානය දක්වා දැන ගත යුතු දේ පිළිබඳව විස්තර දක්වා ඇත. ඒ සඳහා ශිල්පියා සතු විය යුතු අවශ්‍ය කුසලතා සහ ගුණාංග ද, අවශ්‍ය ද්‍රව්‍ය ,පෝරුව සකස් කිරීම, ඒ ඒ අවස්ථාවට අදාල කරගත යුතු දුරුලභ ගායනා ද මෙහි ඇතුලත් කර තිබීම විශේෂත්වයකි. ඒවා මා විසින්ම අධ්‍යයනය කර ලබා ගත් ඒවා බව සඳහන් කළ යුතුමය.

වර්ථමානයේ හිස වෙස් බැඳීමේ මංගල්‍ය පාසල් හා වෙනත් ආයතන මගින් සිදු කරන බව පෙනේ . එහි ගුණාත්මක භාවය පිලිබඳ ගැටළු සහගත තත්වයන් මතුවී ඇති හෙයින් වෙස් මංගල්‍යයට අදාල සිරිත් විරිත් ද මෙම කෘතියෙහි ඇතුළත්ය. මෙම කෘතිය පාසල් වෙත යොමු කිරීමෙන් සිසුන් හා ගුරු භවතුන් එහි සංස්කෘතිමය හා ගුණාත්මක වටිනාකම හඳුනාගන උසස් වෙස් මංගල්‍යය කටයුතු සඳහා යොමු වනු ඇත.

වර්ථමාන පාසල් පද්ධතියෙහි හෝ නර්තනය උගන්වන ආයතන වල වාදනය සඳහා භාවිතයට ගන්නා තම්මැට්ටම් කඩිප්පුවක් හෝ දවුල් කඩිප්පුවක් කැඩී ගිය අවස්ථාවන්හි දී අදාල වාද්‍ය භාණ්ඩය වාදනය කිරීමට ගන්නා අධාරකය වන කඩිප්පුව වෙනුවට මොනයම් හෝ කෝටුවක් තෝරා ගනී. ඇතැම් විට අවස්ථාවාදීව බිම වැටුණු ලීයක් වුවද භාවිතා කිරීම කණගාටුවට කරුණකි. වාදනය කරන්නාගේ අරමුණ වන්නේ මොනයම් හෝ ශබ්දයක් ගැනීම පමණි. එබැවින් කඩිප්පුවක් නිර්මාණය කර ගැනීමට, එය අත්හදා බැලීමට මෙම කෘතිය තුළින් කෙරෙන මඟ පෙන්වීම කාලෝචිතය.

මිනිසුන්ගේ ජීවිත පැවැත්ම සඳහා අවශ්‍ය විනෝදය සහ අත්දැකීම ඉතා වැදගත් වනු ඇත. තරුණ පරපුර පාසල් අධ්‍යාපනයෙන් පසු ඵලදායී ලෙස විනෝදය ගත නොකරනු ඇත. සමාජ මාධ්‍ය ජාලාවල ඇති නිසි ඵලයක් රහිත වීඩියෝවක් බලා සතුටු වීම එතරම් යහපත් කටයුත්තක් නොවනු ඇත. තමා විසින්ම යම් නිර්මාණයක් කර එය නැවත නැවත බලා රසවිඳීමෙන් ලබන අත්දැකීම ජීවිත නිර්මාණයට මහත් උපකාරී වනු ඇත. මෙම කෘතියෙන් වෙස් මුහුණක් සරලව නිර්මාණය කර ගැනීමට අත්වැලක් සැපයේ. ඒ අනුව මෙම කෘතියෙන් ලබන අත් දැකීම තුළින් තමාගේ ජීවනෝපාය ද සාර්ථක කරගැනීමට අත්වැලක් සලසා ගත හැකිය.

මෙම කෘතියේ සියළුම අංග හොඳින් අධ්‍යයනය කර, අත්හදා බැලීම තුළින් අනාගතයේ නොමඟ යනවා වෙනුවට වඩාත් ඵලදායී ජීවිතයක් සකසා ගැනීමට මහත් පිටිවහලක් ලබා ගත හැකි බව විශ්වාසයයි.

## නර්තන විෂයෙහි ගුණාත්මක සංවර්ධනය

සුසමාහිත පෞරුෂ වර්ධනයක් උදෙසා විඥාන, රසඥතා, ආකල්ප හා සක්‍යතා සංවර්ධනයත්, ආචාර ධර්ම සුරක්ෂිත කිරීමටත්, සාම්ප්‍රදායික නර්තන අංග සංරක්ෂණය කොට ගුණාත්මක බවින් යුතු දරුවෙක් අනාගත සමාජයට දයාද කොට එතුළින් කුසලතා පූර්ණ දරුවෙකු ප්‍රතිනිර්මාණය කරන ක්‍රියාවලියේ දී නර්තන අංශයට පැවරී තිබෙන කාර්යය භාරය අතිවිශාලය. අතීත පාසලක් තුළ නර්තනය ක්‍රියාත්මක වූයේ පිළිගැනීමකට, පෙරහැරකට, සුවිශේෂී උත්සව අවස්ථාවකට නර්තන අංග ලබා දීමට වුවත්, වර්තමාන පාසල් ඒ ක්‍රියාවලියෙන් බැහැරව භාවාත්මක දරුවෙක් ප්‍රතිනිර්මාණය කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි ක්‍රියාත්මක වී තිබීම අගය කල හැක. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සමස්ත පාසල් පද්ධතිය පුරාවට නර්තන විෂය උදෙසා විශාල මුදල් ප්‍රමාණයක් ප්‍රවේශ ගත කිරීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත් කිරීම උදෙසා විශාල ගුරු සංඛ්‍යාවක් ප්‍රවේශ ගත කිරීම හරහා මෙම විෂය වඩාත් පුළුල් වූ පරමාර්ථයකින් ක්‍රියාත්මක විය යුතු ය. මේ සඳහා විෂය භාර ගුරුභවතා, ගුරු උපදේශකවරයා විෂය හා සබැඳි විෂය භාර අධ්‍යක්ෂකවරයාගේ වගවීම හා වගකීම ඉතා වැදගත්ය. පාසල් විෂයමාලාව තුළ පමණක් රැඳී නොසිට පාසල් කාලය අර්ථාන්විතව හැසිරවීමත්, පාසල් කාලයෙන් පසු තම සිසු සිසුවියන් සමඟ විෂය ප්‍රවර්ධනාත්මක කටයුතු කෙරේ නැඹුරුවීමත් ගුරුභවතෙකු සතු වගකීමක් වනු ඇත.

ඇතැම් දරුවන් තම නිර්මාණ ශක්තීන් වේගයෙන් නිර්මාණ දායකත්වයට යොදා ගනු ලබයි. ඒ සඳහා මාර්ගෝපදේශයන් අවශ්‍ය වේ.විෂයය නිර්දේශය අනුව සැකසී ඇති විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය අපට වෙනස් කළ නොහැක. විභාග ප්‍රතිපලයක් මත නිලධාරීන් ගුරුභවතුන් ශිෂ්‍යයන් වෙහෙසෙති. ඇතැම් දරුවන් විභාගය අසමත් වී අධ්‍යාපනයෙහි ජීවිත ගමනට තිතක් තබාගැනීම පමණි. ඇතැම්විට සමහර වෘත්තික අධ්‍යාපනය යනුවෙන් නැවත නැවත සිදුවන්නේ පාඩම් කිරීමය. න්‍යායිකව ඉගෙන ගත් දේ කොලයක් පැණකින් ඉදිරිපත් කරති. එහෙත් අතීතයේ නර්තනය හා බැඳි බොහෝ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ගුරු ගෙදර අධ්‍යාපනයෙන් කීහිප දෙනෙකුට හෝ අත්දැකීම් ලබා දී ඇත. අධ්‍යාපනයෙන් ලබන

අත්දැකීම  දරුවන් සමාජ ගතවීමෙන් පසුව තමාට මෙන්ම සමාජ මෙහෙවරකට උපකාරී කරගැනීම වටිනේය. එය ගුණාත්මක අධ්‍යාපනයක් තුල තිබිය යුතුම කරුණක් වන්නේය. නර්තනය විෂයය යනු ශ්‍රී ලාංකිය සංස්කෘතිය සමාජයට දායාද කරන එකම විෂයයයි. නර්තනය හා බැදි සාරධර්ම හා සිරිත් විරිත් ලාංකික මනුසත්කම ඇති මිනිසකු බිහිකරන්නක් බව  හැමදෙනාම දැනගත යුතු කරුණක් වන්නේය . එහෙත් වාණිජමය තත්වයන්  හමුවේ එහි ගුණාත්මක බව සහ හර පද්ධතීන් විනාශාභිමුඛයට ළගා වෙමින් පවතී. එබැවින්  යහපත් සමාජයක් සෑදීමට අවශ්‍ය කුසලතා ගුණාංග  නර්තන කලාව හා බැදී පවතින බවත්, එහි වටිනාකම ලොවක් පුරා දෘශ්‍යමාන කරවීමට විෂයය හා බැදී පවතින බොහෝ දේ පරම්පරාගතව සැඟවීමට වඩා පෙන්වා දීම ඉතා වැදගත් වෙයි. නර්තන විෂයය හා බැදී පවතින අගයන් පෙන්වාදීමෙන් නර්තන විෂයෙහි ගුණාත්මක සංවර්ධනය යහපත් මානව සමාජයක් බිහිකිරීමට පුරෝගාමී වන බව පැහැදිලිය.

# මංගල පෝරු චාරිත්‍ර විධි

වර්මානයේ සමාජීය වශයෙන් ඉතා ඉහළ ඉල්ලුමක් ඇති ස්වයං වෘත්තියක් ලෙස මංගල පෝරු චාරිත්‍ර ඉතා වැදගත්ය. ඒ සඳහා ප්‍රමාණාත්මක වශයෙන් පුදගලයන් සිටියද , ගුණාත්මක වශයෙන් අඩුවක් දක්නට ලැබේ. පවතින මංගල පෝරු චාරිත්‍ර සිදුකිරීමට අවශ්‍ය මානව සම්පත් හිඟය වලක්වා ලීමට නම් ඒ පිලිබදව මනා දැනුමක් ඇති පුද්ගලයන් අප සතු විය යුතුය. අප රටේ දැනට පවත්නා මංගල පෝරු චාරිත්‍ර විධිවල ප්‍රාදේශීය වශයෙන් වෙනස්කම් ද දක්නට ලැබේ. කෙසේ වෙතත් ආධුනිකයෙකුට ගැලපෙන පරිදි සියළුම ප්‍රාදේශීය වෙනස්කම් අධ්‍යයනය කරමින් අංග සම්පූර්ණ චාරිත්‍ර විධි සහ ගායනා මෙම කෘතියෙහි ඇතුලත් කර ඇත.

ප්‍රථමයෙන්ම දෙපාර්ශවයම කතාබහ කර මනමාල මහත්මියගේ පාර්ශවයෙන් මංගල සුභ නැකැත් හෝරා සාදාගත් පසු පෝරු චාරිත්‍ර සිදු කරන ශිල්පියා හමුවී බුලත් හුරුළු දී තම දියණියගේ මංගල දින පෝරු චාරිත්‍ර සිදු කරන ලෙස ගෞරවණීය ආරාධනයක් කරයි. ශිල්පියා විසින් එම සුභ කටයුත්ත භාරගත යුතු වන්නේ අවංකවමය. ඒ මක් නිසාද යත් එම දිනයේ වෙනත් වැඩ කටයුතු භාර ගැනීම නොකළ යුතුය. තම සේවාලාභියාවන මනාල මහත්මියගේ පාර්ශවයට පොරොන්දුවක් විය යුතු වන්නේ කුමන බාධාවකින් හෝ පෝරු චාරිත්‍ර ඉටු කිරීම මග හැරී යාමෙන් පාර්ශව කීපයක්ම අපහසු තාවයට පත් වීම නිසාය.

## මංගල පෝරු චාරිත්‍ර ශිල්පියා සතු විය යුතු ගුණාංග සහ කුසලතා.

පෝරු ශිල්පියෙකුවීමට සුදානම් වන්නෙකු ප්‍රථමයෙන්ම ලැජ්ජාව, බිය සහ කම්මැලිකම යන තුන්දෝෂයන් දුරුකර ගත යුතුය. අප සමාජයේ ප්‍රවීණත්වයට පත්වූ කිසිම පුද්ගලයෙක් මල් ඉසින ලද පාවාඩ මතින් දියුණු තත්වයට පැමිණි අය නොවන බව සිහි තබා ගත යුතුය.
අවශ්‍යවන්නේ තමාගේ සිත අවශ්‍ය අරමුණ කරා යාමට අධිෂ්ඨාන කර

ගැනීමය. ..“මට කළ හැකිය... යන්න සිහියේ තබා ගැනීම ඉතා වැදගත් වන්නේ ඒ නිසාය.

“ යමක්  කරන විට අන් අය හිනාවේවි..... ,“ මා කරන දෙය වැරදි ද දන්නේ නෑ... යනාදී  පූර්ව නිගමනයක් වලින් ඈත්වීමට තමාගේ සිත ශක්තිමත් කර ගත යුතුමය.

පහත සදහන් කුසලතා  සහ  ගුණාංග තමා විසින්ම සංවර්ධනය කර ගැනීමට හැකිවීම තුළින් ගුණාත්මක වූත්, සමාජ පැසසුමටලක් වූත්, වෘත්තිකයෙකු වීමට හැකියාවක් ලැබීම නොඅනුමානය.

- **ඉවසීම.**

ශිල්පියා විසින් තම කාරිය ඉතා ඉවසීමෙන් සිදු කළ යුතුය. කලබලවීම තුළින් තමුන් කරන කාර්යය පිළිවෙලට ඉටු නොවීමට ඉඩ ඇත. එබැවින් සිත සන්සුන්ව තම කරන කාර්යය ඉටු කල යුතුව ඇත. එය අත්දැකීමෙන්ම ලබා ගත යුතු දෙයකි. ඉවසීම දූර්වල ශිල්පියෙකු අතින් බොහෝ අතපසුවීම් සිදුවිය හැකිය. ඇතැම් විට කේන්තිය වැනි දූර්වලතා තුලින් තමාගේ ගුණාත්මකබව නැතිවී යාමටත්  අන් සමාජය ඉදිරියේ අප්‍රසාදයට පත්වීමටත් හැකියාවක් පවතින බව සිහියේ තබා ගත යුතුය.

- **කැපවීම හා වගවීම.**

තමා භාරගත් මංගල පෝරු කටයුත්ත ඉතා කැපවීමෙන් ඉටුකල යුත අතර එහි කිසිදු අඩුපාඩුවක්  නොවන ආකාරයට වග බලා ගැනීම සිහි තබා ගත යුතුය. තමා ගේ සේවාලාභියා තමාට පවරන ලද  චාරිත්‍ර  ඉටු කිරීමේ කාර්යය  නිසි පරිදි පිරිසිදුව හා යහපත්ව ගුණාත්මකව ඉටු කර දීමට බොහෝ කැප කිරීම් කල යුතුව ඇත. සේවා ලාභියාගේ ආර්ථිකමය හා සමාජ වටපිටාව  අනුව දිය හැකි පහසුකම් හොදින් තේරුම් ගැනීම මෙහිදී වැදගත්ය.

- **කාලයට වැඩ කිරීම.**

වර්ථමානයේ බොහෝ ශිල්පීන් තම භාරගත් කාර්යය ඉටු කිරීම සඳහා කල් වේලාව ඇතිව චාරිත්‍ර ස්ථානයට නොපැමිණීම කණගාටුවට කරුණකි. ශිල්පියා විසින් තමා පෝරුව සැරසීම සහ අනෙකුත් කාර්යන් සදහා ගත කරන කාලය පිලිබද විශ්වාසයක් ගොඩ නගා ගත යුතුය. එබැවින් තමා පැමිණෙන වේලාව අදාල පාර්ශවයන් වෙත දැන්වීමට මතක තබා ගත යුතුය. නො එසේ නම් ඔවුන් දැඩි අපහසුතාවයකට හා මානසික පීඩනයකය ලක් වනු ඇත.

අදාල පාර්ශවයන් විසින් **"තාම ආවෙ නෑ...අනේ මන්ද ...මොනවා කරන්නද මන්දා ...ආදී ලෙස මානසික පීඩාවකට ලක් වනු ඇත** . එබැවින් කල් වේලා ඇතිව අදාල ස්ථානය වෙත තමා යාම ඉතාම වැදගත්ය.

- **පිරිසිදුකම.**

ඇතැම් ශිල්පීන් මෙම කාර්යාය සඳහා පේවීමක් හෝ පිරිසිදු වීමක් සිදු නොකරයි. එසේ අපිරිසිදුව පෝරුව කිරීමෙන් වස් වදින බවත් යුවලට නරකක් සිදුවන බවත් පුරාතන විශ්වාසයයි.

හිස, දිව ,කට,මැද...
කිළිවලට නොයා හිද..
සුදු පිරුවට ඇද...
යා යුතු නිබද....

ආදි ලෙස ශිල්පියා විසින් පේ වීම, පිරිසිදුවීම සිදු කල යුතු වන්නේය. එයට හේතුව වන්නේ බුද්ධ, ධම්ම, සංඝ රත්නයන් වගේම දෙවියන් ද, විශේෂයෙන්ම පැමිණ සිටින පිරිවර ද තමා ඉදිරියේ සිටින බැවිනි. මෙම කටයුත්තේ නායකයා වන්නේ ද,

සමීපතමයා වන්නේ ද, චාරිත්‍ර ශිල්පියාමය. ඔහුගේ **මුඛ ගන්දය, ශරීරයේන් පිටවන අපිරිසිදු ගන්ධය , නියපොතු,අත්වල දෙපාවල අපිරිසිදු කම, කොණ්ඩය, ඇඳුම පැළඳුම වගේම අපිළිවෙල බව,** අන් සැම දෙනාම අපහසුතාවයට පත්කරනු හේතු බව මැනවින් වටහාගත යුතුය.

- **ගරුත්වය**

අන් අයට ගරු කිරීම තුළින් තමාට ද ගරුත්වයක් ලැබේ . එබැවින් “ තමා හරි, සියළුම දේ දත් කෙනෙක් යැයි නොසිතා අන් අයත් තමාට වඩා දන්නා බව සිතීමේ ගුණාංගය වැඩි දියුණු කළ යුතුය. ත්‍රිවිධ රත්නය ,දෙවියන්, සභාවේ සිටින සියළුම දෙනා කෙරෙහි ගරුත්වයක් ලබා දී හැසිරීම ඉතා වැදගත්ය.

- **නිහතමානී කම**

පෝරු ශිල්පියාගේ ක්‍රියාකලාපය තුලින් නිහතමානි බව ප්‍රදර්ශණය විය යුතුය. ඔහුගේ හැසිරීම, කතා බහ, චරිතවත් බව ද මෙහී දී සිහිපත් කළ යුතුය. චාරිත්‍ර කරන දවසට පමණක් සීමා නොවී සමාජ පරිසරය වගේම තම නිවසේ දී ද ඒ බව දෘශ්‍යමාන කරවීම සඳහා කටයුත කිරීම ඉතා සුභ දායකය.

ඉහත කී යහපත් ගුණාංග සංවර්ධනය කිරීම තුළින් ගුණාත්මක පෝරු චාරිත්‍ර ශිල්පියෙකු විමට හැකියාව ඇති අතර, එම පුද්ගලයා ගේ ජීවන තත්වය උසස් කර ගැනිමට ද හැකියාවක් ලැබෙනු ඇත. මේ හේතුන් නිසා ඔහුට සමාජයෙන් ලැබෙන ඉල්ලුම ද වැඩිවනු ඇත.

- **සුදුසු තැනට ගැලපෙන පරිදි කටයුතු කිරීම.**

තම සේවාලාභියා වන මනාල මහත්මියගේ පාර්ශවය හෝ මනමාල මහතාගේ පාර්ශවයෙන් කුමන හෝ අඩුපාඩුවක් සිදුවුවහොත් එය විවේචනය කර සිටිනවා වෙනුවට ඒ සඳහා සුදුසු

විකල්ප ක්‍රියාවක් කර අඩුපාඩු නොවූවා සේ කටයුතු කිරීම ඉතා වැදගත්ය. ඇතැම් අවස්ථාවලදී අවශ්‍ය ද්‍රව්‍ය වල අඩු පාඩුවක් හෝ වෙනත් අත්‍යාවශ්‍ය දෙයක් රැගෙන ඒමට අමතක වීම් අදාල පාර්ශවයන්ගෙන් සිදුවූ විට තැනට සුදුසු නුවණ භාවිතා කිරීම පෝරු ශිල්පියා විසින් කළ යුත්තක් වන්නේය.

## කුසලතා

පෝරු ශිල්පියා කුමන හෝ ක්‍රම වේදයකින් පහත සදහන් කුසලතා හැකියා සංවර්ධනය කර ගැනීම ඉතා වැදගත්ය. දැනගන යමක් කිරීමෙන් ශිල්පියාගේ ගුණාත්මක බව හා වටිනාකම තව තවත් දීප්තිමත් වනු ඇත. ඒ සදහා මෙම පොත හොදින් පරිශිලනය කල යුතු අතර, වෙනත් ශිල්පීන්ගේ දැනුම ද ලබා ගැනීම විටිනේය. වෙනත් ශිල්පියෙකු පෝරු චාරිත්‍ර ඉෂ්ඨ සිද්ධ කරන අයුරුත්, එහි ගුණාත්මක බව සහ අඩුපාඩුත් හොදින් අධ්‍යයනය කිරීම ශිල්පීය දක්ෂතා සංවර්ධනයට හේතුවක් වනු ඇත. වෙනත් ශිල්පියෙකුගෙන් ඔබ සජීවීව දකින අඩුපාඩු ඔබෙන් නොවන ආකාරයට කුසලතා සංවර්ධනය කර ගැනීම හොදින් තේරුම් ගත යුතු කරුණක් වන්නේය.

- **චාරිත්‍ර පිළිබඳ දැනුම.**

පුරාතණයේ සිට මංගල පෝරු චාරිත්‍ර, ආරම්භය පිළිබද කතා, පෝරු සකස් කිරීම පිලිබඳ මනා දැනුම හා කුසලතාවය, එක් එක් චාරිත්‍ර පිලිබද ඉතිහාසය සහ අන්තර්ගත අවබෝධය, චාරිත්‍ර අනු පිළිවෙල, ඒ සදහා භාවිතයට ගත යුතු දේ සහ කරන ක්‍රියාකාරකම් ආදිය පිළිබද දැනුම තිබිය යුතුය.

- **ගායන හැකියාව සහ කථිකත්වය.**

මංගල සබාවට පැමිණි සැම දෙනා වගේම දෙවියන් සතුටු කරවන ආකාරයේ වාචික හරඹ භාවිතා කළ යුතුය. ඇතැම් විට

ශබ්දය පමණක් ගැන සිතන ශිල්පියා ගායනාවල සංයමය, හඬ පාලනය ගැන නොසිතයි. එබැවින් පැමිණ සිටින්නන් පිනවන ආකාරයේ ගායනා සහ කීම් ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුය. මංගල සභාව පිළිගෙන පංචශීලයේ පිහිටුවා අවසානයේ පෝරුවෙන් බස්සවා මංගල පහන් දල්වනතුරුත් ශිල්පියාගේ හඬ පාලනයේ රසවත් බව නොකඩවා පවත්වා ගැනීම සිදු කළ යුතුය. ඇතැම් විට සමහර ශිල්පීන් කොලයක් බලා කවි ගායනා සහ කීම් සිදු කරන අතර, මගදී විවිධ ගායනා වල පැටලීම්, අස්ථිර භාවයන් හේතුවෙන් තමා මෙන්ම සමස්ත උත්සවය ක්‍රියාවලියම අපහසුතාවයන්ට පත්වනු ඇත. වචන හැසිරවීමේදී හැම වචනයකම අර්ථයක් තිබිය යුතු අතර, ඒවා හැම දෙනාටම තේරුම් ගැනීමට හැකියාවක් තිබිය යුතුය. උදාහරණයක් ලෙස " **ම්...ම්....ම්....** යනුවෙන්ද.."**අ...අ....අ...**ආදී ලෙස අනවශ්‍ය හඬ භාවිතා නොකළ යුතුය.

- **කලාත්මක කුසලතාව**

පෝරුව සැකසීම සදහා ගන්නා අමුද්‍රව්‍ය සහ අනෙකුත් සියළුම දේ අපූර්වත්වයෙන් යුතුව ගලපා ලීම ඉතා වැදගත්ය. පෝරුවේ දිග පළල, උස ප්‍රමාණය ආදියට ගැලපෙන පරිදි කලාත්මකව සකස් කළ යුතුය. යොදා ගන්නා සියළුම දේවල් හි වර්ණය සහ හැඩය, ප්‍රමාණය, එකිනෙකට ගැලපේ දැයි සොයා බැලීම වැදගත්ය . සභාවට පැමිණෙන සියළුම දෙනා පෝරු සැරසිලි සහ පිලිවෙළ කෙරෙහි ඉතා ඕනෑකමින් බලා සිටී. විශේෂයෙන් මනාල යුවල එදින සහ පසු කාලීනව තම මංගල දිනයේ ඡායාරූප සිහිපත් කරනු ඇත . එහිදී ශිල්පියාගේ සැරසිලි අපූර්වත්වයෙන් යුක්තව දිස්වන පරිදි සැරසීම ඉතා වැදගත්ය. එම සැරසිලි වල අපූරු බව සහ කලාත්මක බව දකින වෙනත් යෝජිත මනාල යුවලක් වුවද ශිල්පියාගේ සේවය බලාපොරොත්තු වනු ඇත. මෙම කුසලතාවය පුරාණ වූත්, නව්‍යමය වූත්, පරිපූර්ණත්වයක් වීම තුළින් ශිල්පියාට ඇති ඉල්ලුම වැඩි වනු ඇත. එබැවින් දිනෙන් දින මෙම කුසලතාව සංවර්ධනය කර ගැනීමත් අත් දැකීම් ලබා ගැනීමත් ගුණාත්මක ශිල්පීයත්වයට හේතු සාධක වනු ඇත.

## මංගල පෝරු සැරසීම සහ චාරිත්‍රවලට අවශ්‍ය දේ.

- කැකුළු සහල්. (සුදු,රතු)
- ධාන්‍ය වර්ග ( මුං / පරිප්පු / කව්පි ආදී විවිධ වර්ණයන්ට ගැලපෙන පරිදි)
- පොල් මල්.
- සුදු රෙදි මීටර් 02 ක් පමණ.
- කලස් මුට්ටි / පුන් කලස් 4 ක්.
- මැටි පහන් 4 ක්.
- පොල් තෙල් .(අවශ්‍ය ප්‍රමාණයට)
- පහන් තිර.
- ගිනි පෙට්ටියක්.
- පැන් කෙණ්ඩියක්.
- රන් රිදී හුයක් (නූලක්)
- පිරිත් නූලක්.
- අත පැන් වක්කරන පැන් එකතු කිරීමට නැවුම් භාජනයක්.
- බුලත් හුරුළු.
- පොල් ගෙඩියක් හෝ දෙකක්.
- පිරිසිදු මන්නයක්.
- පොල්ගෙඩිය බිඳීමේ දී අපවිත්‍ර බව වැලැක් වීමට පිස්නාවක් .
- කපුරු පැකට්.
- සුවඳ හඳුන් කූරු.
- ලඳ පස් මල්.
- පඬුරු (21/14 ආදී ලෙස)
- සල් මල් / නාමල්/ ආදිය. (සැරසීමට)
- නාදළු /හීරුස්ස /මොල්ගස / ආදී දේවල්.
- කිල්ලෝටයක්.
- ගිරයක්.

- කච්ච කිරිකඩ සේලය සඳහා සුදු රෙදි. ( යාර 7/ 9/ 14 ආදී ලෙස)
- සුදු රෙදිකඩක් හෝ හිසට බඳින තුවායක්.

## මනමාල මහතා රැගෙන ආ යුතු දේවල්.

- සුදු රෙද්දක්.
- දෙවෙනි දිනයට ඇන්දවීම සඳහා හැට්ටය සහ සේලය (සළු )
- තැල්ල,මාලය.
- කච්චකිරිකඩ සේලය.
- ගිරය / කිල්ලෝටය.
- රන් මුදු (මනාළියගේ)
- මාමා / මව්පියන්ට වැඩිහිටි සළුපිළි හෝ තෑගි.
- මනාල මහතාගේ පැමිණෙන පිරිසේ සංඛ්‍යාවට අදාල බුලත් සංඛ්‍යාව.
- ජය මංගල ගායනා කරන පිරිසට මුදල් හෝ තෑගි.

## පෝරුව සකස් කිරීම.

අතීතයේ දී පෝරුව සකස් කිරීම සඳහා මනමාල මහත්මියගේ නිවසේ සුදුසු ස්ථානයක් තෝරා ගනී. එහෙත් වර්ථමානයේ හෝටලයක් හෝ සුදුසු ස්ථානයක් භාවිතයට ගනු ලැබේ. පෝරුව සකස් කිරීම සඳහා සුදුසු දිසා තීරණය කරනු ලබන්නේ නැකැත් ශිල්පියා විසිනි. ඒ සඳහා මරු සිටින දිසාව හා වේලාව හැර සුභ දිනයක් සහ සුභ දිසාවක් තෝරා ගනී. මනාළ යුවල පෝරුවට නැංවීමේ දිසාව අනුව පෝරු සකස් කරන දිසාව තිරණය කරනු ලැබේ. බොහෝ අවස්ථාවලදී නිවසේ හෝ මංගල උත්සවය පවත්වන ස්ථානයේ පිරිසකට පෙනෙන පරිදි සහ පිරිසකට සහභාගී විය හැකි නිදහස් ස්ථානයක් සොයා බැලීම ඉතා වැදගත්ය. අතිතයේ දී නම් ඉතා මැනවින් ආලෝකය සහ වාතය ඇති ස්ථානයක් තෝරාගනු ලබයි.කෙසේ වෙතත් මංගල පෝරුවේ උඩු වියන් සකස් කරන්නේ නම් මනමාල යුවලගේ උස සහ අඳින ඇඳුම පිළිබඳ සැළකිලිමත් විය යුතුය.ඇතැම් අවස්ථාවලදී මනමාල මහතාගේ හිසට පළඳින ඔටුන්න

පෝරු සැරසිලිවල දැවටෙන අවස්ථා ඇති අතර, එයින් යුවතිපතීන් දෙදෙනාම දැඩි අපහසුතාවයකට පත්වනු ඇත . මේ පිලිබඳව පෝරු සරසන විට දැනුවත් විය යුතුය. නූතනයේ මංගල පෝරුවේ උස දිග පළල ගැන අවධානය යොමු නොකිරීමෙන්  චාරිත්‍ර විධි විධිමත්ව කිරීමට නොහැකි තත්වයන්ද තිබෙන බව සිහියේ තබා ගැනීම වැදගත්ය.







පෝරු බිම් සැරසිලි







පෝරු බිම් සැරසිලි

තවද වැඩි වේලාවක් පෝරු චාරිත්‍ර සදහා මනාළ මහතා සහ මහත්මිය එකම ස්ථානයේ සිටීමේ පහසුව පිළිබඳව ද සැළකිළිමත් විය යුතුය.

පෝරුව සකස් කිරීම සදහා අළුතින්ම කපා පවිත්‍ර කරන ලද සඳුන්, කොස්, කොහොඹ, රුක් අත්තන ආදී ලෑලි හෝ කිරි ගසක ලෑලි මේ සදහා භාවිතා කරයි. එහි විශ්වාසය වූයේ සෞභාගය හා සාරවත් බවය. එසේ නොකිරීමෙන් යුවතිපතීන් හට දරුඵල නොමැති බව විශ්වාසයයි. ගස කපනු ලබන්නේ ද සුභ හෝරාවකට බව පුරාතන ශිල්පීන්ගේ මතය වී ඇත.

පෝරුවේ පාදයට දමන ලබන ලෑල්ලට ඇණ නොගැසීමටද පුරාතන ඇදුරු ශිල්පීන් වග බලාගෙන ඇත. එයට හේතු ලෙස ඔවුන් පෙන්වා දෙනු ලබන්නේ ඇන ගැසීම හේතුවෙන් යුවතිපතීන් හට අනාගතයේ කරදර සිදුවිය හැකි බව යන්නය.

ඈත අතීතයේ පෝරුව සකස් කර ඇත්තේ ඉතාම සරල ආකාරයට බව පැහැදිලිය.

**ගෙබිම ගොම මැටි ගා**
**පිරිසිදු කර කහ දියර ඉස්සවා**
**පැදුරක් අතුරවා**
**නැවුම් සුදු රෙදිකඩක් තැබුවා.....**

**කැකුළු සහල් අට මහල ද,**
**දෙපයට තොල බෝ හී රුස්සද,**

**උඩට උඩුවියනයි නව කොළවලින් සැරසේ**
**පයට පාවඩයයි... සතර කොන් සතරේ**
**සිව් වරම් දෙවිටයි පුන් කලස් සැදුනේ**
**සියළු දෙවිටයි මල් බුලත් පඩුරුද පිදුනේ.......** ආදී වශයෙන් කවි ගායනා වල ඇත.

කෙසේ වෙතත් පෝරුව සකස් කිරීමේදි තල 03 ක් හෝ කිහිපයක් භාවිතා කරයි.



පෝරුවට ඇතිරීමට  සුදු පිරුවටයක්ද, ඒ මත අටමගලක්ද සාදාගැනීම අතීතයේදී සිදු කර ඇත. වර්ථමානයෙහි  පුරාතන හා නව්‍යමය කැටයම් වලින් යුක්ත සැරසිලි වලින් පෝරුව සකස් කරනු ඇත. එක් එක් එක් ශිල්පියාගේ දක්ෂතාවය  ඒ තුලින් විදහා පානු ඇත. එහිදී වවිධ වර්ණ සහ හැඩ  භාවිතා කිරීම තුලින් පෝරුව අලංකරණය වැඩි වේ.  ඒවායේ නිමාව පිළිවෙල පිලිබඳව සැළකිලිමත් විය යුතුය. ඇතැම් විට යොදා ගන්නා අමුද්‍රව්‍ය  අපිළිවෙලට  සකස් කිරීම තුළින් සමස්ත ක්‍රියාවලියම අසාර්ථක වනු ඇති බව ශිල්පියා දැන ගත යුතුම  වන්නේය.

පෝරුවේ සතර කොනෙහි පුන් කලස් තබා, සාරවත් පොල් මල් සතරක් හිඳුවා බුලත් . පඬරු සහ පොල් තෙල් පහනක් තැබීම සිරිතය. සරසන ලද පෝරුවේ අනෙක් දේවල් වලට අවහිර නොවන පරිදිත්, ගිනි ගැනීම පිළිබඳ අවධානය යොමු කිරීමත් ඉතා වැදගත් ය. විශාල ප්‍රමාණයේ පහන්, හඳුන් කූරු දැල්වීමෙන් අනිසි පල විපාක සහ අනතුරු ඇති වූ අවස්ථා ද දක්නට ඇත. මනමාල මහත්මියගේ දුහුල් සළු ඉතා ඉක්මනින්ම ඇවිලෙන සුළු එකක් නම් ජීවිත හානි පවා සිදුවිය හැක . එහි වගකීම  පෝරු සරසන ශිල්පියාගේම  බව තරයේ සිතට ගත යුතු කාරණාවක් වනනේමය. පෝරුවේ  ඉදිරි පස බුලත් පඬුරු තැබිය යුතුය. එයද පිළිවෙලකට තැබීම ඉතා වැදගත්ය. කැකුළු සහල් පොල් ගෙඩිය තබන ස්ථාන වන්නේද

පිටුපස කොටසෙහි නොව ඉදිරි පසය. අතපැන් කෙණ්ඩිය, කච්චකිරිකඩ සේලය ආදියද නිශ්චිත ස්ථානයක තබා ගැනීම වැදගත්ය. මනාල යුවල පෝරුවෙන් බැස්ස වීමෙදී බිදීමට ඇති පොල් ගෙඩිය ද පිස්නාවක් මත තැබිය යුතුය. ඇතැම් ශිල්පීන් පොල් ගෙඩිය මත බුලත් හා පඬුරක්ද තබන අතර, ඇතැමෙක් හීරැස්ස කොලයක්ද තබනු ඇත. පොල් ගෙඩිය බිදීම සදහා මාමා කෙනෙකු සිටිය යුතු අතර, භාවිතයට මන්නා පිහියක් හෝ කැපෙන ආයුධයක් සුදානම් කර තබා ගැනීම ශිල්පියාගේ වගකීම වේ.

## පෝරුව චාරිත්‍ර සදහා පෙර සදහා සූදානම

- දෙපාර්ශවයේ නිශ්ශබ්ද තාවය.
- පෝරුව සකසා සරසා අවසන් කර තිබීම.
- පහන් දැල්වීම සදහා සුදානම් කරන පහන්. ගිනිපෙට්ටිය, බුලත් පඬුරු ආදිය සූදානම් කර තිබීම.
- අදාල පාර්ශවයන් දැනුවත් කිරීම.
- මනමාලයාව සභාව දෙසින් පෙනෙන විට වම් පසින්ද, මනමාලියව සභාව දෙසින් බලන විට දකුණු පසින් සුදානම්ව සිටීම (මනමාල මහත්මියගේ දකුණු උරහිස සහ මනමාල මහතාගේ වම් උරහිස එක්වන ආකාරයට) පෝරුවේ දකුණු පස මනමාල මහතාද, වම් පස මනමාල මහත්මිය ද සුදානම් කර සිටීම.
- පෝරුව නැංවීම සදහා මාමා වරුන් /පියවරුන් සුදානමින් සිටීම.
- මුදු , මාල සුදානම් කරගන්නා ලෙස අදාල දෙපාර්ශවයම දැනුවත් කිරීම.
- මනාමාලයා සහ මනමාලිය පෝරුව නැංවීමට පෙර කෑමක් බීමක් ගත්තාද යන්න සොයා බැලීම. (ඇතැම් විට වෙහෙස නිසා අපහසුතාවයන්ට පත්වීම)
- පැන් කෙණ්ඩියේ පැන් තිබේද යන්න විමසා බැලීම (ඇතැම් විට පැන් කෙණ්ඩියේ පැන් නොමැතිව පැන් වැක්කිරීමට යාමෙන් ශිල්පියා දැඩි අපහසුතාවයට හා ලැජ්ජාවට පත්වීම)
- පැන් එකතු කිරීම සදහා සුදුසු භාජනයක්.
- පිරිත් නූල / රන් කෙන්ද.
- කච්ච කිරිකඩ සේලය.(ගිරය සහ කිල්ලෝටය සහිත)

- මනමාළියට ඇන්දවීම සඳහා මනමාල මහතා සාරිය හැට්ටය සුදානම් කර ඇතිද යන්න.
- ජයමංගල ගායනා කරන බාලිකාවන් පෝරු මස්තකයෙහි ආසන්නයේම සිටීද යන්න හා ඔවුන් වෙත ලබා දෙන තෑගි සුදානම්ද යන්න.
- මංගල බෙර ජය සක්නද ශිල්පීන් පෝරුව අසල සුදානම්ද යන්න සොයා බැලීම.
- දෙපාර්ශවයම ලබාදෙන තෑගි බෝග සුදානම්ද යන්න පරීක්ෂා කිරීම.
- නැකැත් පත්‍රය හෝ පෝරු චාරිත්‍රවලට අදාල වේලාවන් ආසන්නයෙහි තබා ගැනීම.
- වේලාව බැලීමට සුදුසු දෙයක්.
- මුට්ට සහිත පොල් ගෙඩියක් හෝ දෙකක්.
- වතුර (අවශ්‍ය වූ විටක පානය කිරීමට)
- පෝරුවේ දී යුවතිපතීන් හට කෑම හෝ බීම ලබා දෙන්නේ නම් කිරිබත් කැවුම් පිගානක්.
- මංගල පහන් සුදානම් ද යන්න.
- යුවතිපතීන් හට පහන් දැල්වීම සඳහා එම ස්ථානයේ ඉටි පන්දමක්.

## පෝරු චාරිත්‍ර කිරීමේ පිළිවෙළ

- සියළුම දෙනා පෝරු මස්තකය ළගට එන ලෙස ආරාධනා කිරීම.
- චාරිත්‍ර ශිල්පියා හෝ පාර්ශවකරුවන් විසින් සතර කොන් පහන් දැල්වීම.
- මනමාල මහත්මියගේ පාර්ශවය විසින් පෝරු චාරිත්‍ර කිරීම සඳහා දෙනු ලබන බුලත් සහ පඬුරු පිළිගෙන උඩු වියනක තැන්පත් කිරීම.
- දෙවියන්ට පඬුරු වෙන් කිරීම.
- සියළුම දෙනා පංච ශිලයේ පිහිටුවීම සඳහා මධුර ස්වරයෙන් සිත සන්සුන්වන ආකාරයේ පන්සිල් ලබාදීම.
- තෙරුවන් නමස්කාර ගායනා කීම.

- අෂ්ඨක කීම. (මේ සඳහා විෂ්ණු/දළදා ආදී අෂ්ඨක ගායනා ඉදිරිපත් කරනු ලබයි.
- බුලත් හුරුළු මාරු කිරීම.
- මනමාලයා විසින් මනමාලියට මාල, තැළි බැදීම.
- සළුපිළි ඇන්දවීම. (සුදු සළුවක් හෝ රන් සළුවක්)
- මුදු මාරුකිරීම ( වෙඳගිල්ලේ මුදු පැළැන්දවීම.මනමාල මහතාග් දකුණු අතෙහිද,මනමාළ මහත්මියගේ වම් අතෙහිද)
- යුවලගේ දෙසුලැඟිළි එක් කොට අත නූල් බැදීම /රන් කෙන්දෙන් බැදීම සහ  මංගල බෙර ජයසක් මැද අත පැන් වැක්කිරීම.
- බාලිකාවන් විසින් ජය මංගල ගායනා කිරීම.
- මනාල මහතා විසින් බාලිකාවන්ට තුටු පඩුරු පිරි නැමීම.
- මනමාල මහත්මියගේ මවට කච්චකිරිකඩ සේලය පිළි ගැන්වීම.
- පියාණන්ට, මාමා වරුන්ට, බුලත් දීම සහ තෑගි දීම.
- කිරිබත් හෝ කැවිලි කැවීම.
- සිරස පාද ගායනා, සත් දින ශාන්තිය,  නවග්‍රහ ශාන්ති ගායනා කර ආශිර්වාද කිරීම.
- පෝරුවෙන් බැස්සවීම.
- පොල් ගෙඩිය බිදීම.
- මංගල පහන් දැල්වීම.
- පැමිණ සිටින සියළුම දෙනාට වන්දමාන කිරීම.
- යුවතිපතීන්ට සුදානම් කර ඇති ආසනයෙහි අසුන් ගැනීම.

මෙම කටයුතු එක් එක් චාරිත්‍ර ශිල්පියා හා  ප්‍රදේශ  අනුව වෙනස් වේ.

## චාරිත්‍ර ඉෂ්ඨ සිද්ධ කිරීම.

- **පළමුව පහන් දල්වා සුවඳ දුම් ඇල්ලීම.**

- **සභාවෙන් අවසර ගැනීම සඳහා භාවිතයට ගත හැකි ගායනා සහ කීම්.**

ආයුබෝවන්.. වාසනාවන්ත මේ මනාල යුවල (දම්පතීන් යුවල) ඇතුළු මේ ගෞරවණීය මංගල සභාවෙන් අවසරයි..සිංහලයේ ආර්ය අභිමානවත් හෙළ කුල සිරිත් චාරිත්‍රයන් අදත් මේ වාසනාවන්ත දෙපලට සිරිත් චාරිත්‍රයෙන් පෝරු මස්තකාරූඪ කිරීමටයි මේ සූදානම..යහපත්ම සුබ කාලහෝරාව නැත්නම් සුභ මුහුර්තිය ළඟාවන බැවින්... විශේෂයෙන්ම මතක් කළ යුත්තේ මනමාල මහත්මියගේ මව් පිය පාර්ශවයන් හා මනමාල මහත්මයාගේ මව් පිය පාර්ශවයන් වන සිව් පාර්ශවයෙන්ම මා ගෞරවයෙන් හා කැරුණිකව ඉල්ලා සිටින්නේ.. ඔබ මේ දෙදෙනාට ආශීර්වාද කරන්නට පැමිණියේ නම්... ඒ පිරිසිදු යහපත් චේතනාව පෙරදැඩි කරගෙන ඔබ තමුන්නාන්සේලාගේ නිශ්ශබ්දතාවය මා වෙත ලබා දෙන ලෙසයි...

### <u>අවසර ගැනීමට කවියක්</u>

සිංහල කුල සිරිත ඉහළින් පිලිගන්න
නව යුවලකට ආසිරි සෙත සලසන්න
සුභ මොහොතකින් පෝරුව මත නංවන්න
මංගල සභාවෙන් මට අවසර දෙන්න

### පුන් කළසට පහන් දැල්වීම සඳහා කවියක්.

වදුරුද බෝසත් ඉපදී පන්සිය පිරිවර සමගින
ගැඹුරු ගඟෙන් එතෙර වන්න වැලක් සදා ඉන බැදගෙන
නපුරු එදෙව්දත් එ දවස කැපුවද ගොඩ වී ඉවුරට
ඉඳුරු කොනේ පුන්කලසට පහන් තබමි දොස දුරුවෙන

- **යුවතිපතීන් හා මංගල සභාව පංචශීලයේ පිහිටුවීම.**

පංච ශීලයේ පිහිටුවන විට ඉතා සුමිහිරි මධුර ස්වරයෙන් පන්සිල් ලබා දිය යුත අතර, කඩිනමින් පංච ශීලයේ පිහිටුවීම සුදුසු නැත. තවද පන්සිල් ශිල්පියා විසින් ගායනා කර සියළුම දෙනාට අදාල පන්සිල් ගායනා කිරීමට අවස්තාවක් ලබා දෙනු මැනවි.ඇතැම් අවස්ථාවන්හි දී ශිල්පියා පමණක් ඉතා වේගයෙන් තෙරුවන් ගායනා සහ පන්සිල් පද ගායනා කඩිනමින් ගායනා කරන අතර එය සුදුසු නැතිබව තේරුම් ගත යුතුය.

**නමස්කාර ගාථාවක්.**

සම්මා සම්බුද්ධ ඥාණේන - සම්මා සම්බුද්ධ දේශනා
සම්මා සම්බුද්ධ ලෝකස්මිං - සම්මා සම්බුද්ධ තේ නමෝ....

බ්‍රහ්මේන්ද්‍ර මාධි මඛිලං - භුවනේසු භූතං
මෝහන්දකාර හජිතං - භවභාව හාරං
ලෝකෝත්තර සරණතං -යදිදේව දේවං
ජිනේන්ද්‍ර ෂීහ පවරං - සිරසා නමාමී...

ලොව සත රකිනා පුල්වන් සමන් දෑ සුරන් කැන්
නොදැන මම කියන්නාවූ මේ කවිහි ඇතත් දොස්
එය බැහැර කිරීමෙන් බෝ කලක් ආයු දී සෙත්
අප රකිනා ලෙසින් දෙ අත් මුදුන් දී වදිනෙමි.

සිටිනා ලොකු කුඩා මහත්තැන් වෙතින් දැන්
අවසරය ලැබේවා මේ මගුල් පෝරු සිරිත් කම්
තුතිවදන් ගොතා සෙත් දී මඟුල් කවි කියනෙම්
අසන ලෙස බැතින් ඉල්ලා සිටිනෙමි තුටින් දැන්...

## පෝරුව නැංගවීම සදහා කවි ගායනා.

සෝර කර ඒ සමරසෙන් බිද බුදුවූ දිනු බලයෙන් මඟුල්
නැර සුර බඹ නරන් ඈ සව් සතුන් ජයසිරියෙන් මඟුල්
කාර බැදි මේ දෙදෙන ලබනසෙ සිතා සැප ජයසිරි මඟුල්
සාර පද යුග තබනු මැන මේ පෝරුමත සුසැදූ මඟුල්

ලකුණු දැන අප බෝසතාණෝ විදුරසුන් පිට වැඩම කරමින්
මෙකුණු සසරේ තිබූ කෙලෙසුන් නසා අලුයම බුදු වෙමින්
අකුණු හඬ සේ ගර්ජනා කොට එවසවතු මං බිඳි බලෙන්
දකුණු පය පෙරටුව තබා පෝරුවට ගොඩවෙනු සුබය දැන්

සුවද කුසුම් මාලා චක්‍ර පාඩා හයාස්තං
ගමන ගමන නීලං නීල වර්ණාදි රූපකං
පවන වෙසෙන සාලාං රුඩ රුඩාතිනේත්‍රං
දඹවන ත්‍රිපුට වාස ශ්‍රී රංජන භූම දේවි නමෝස්තුතේ..

ශ්‍රීමත් පංකජ විස්තරෝ හරි හරෝ වායෝ මහේන්ද්‍රෝ නලං
ස්වචන්ද්‍රෝ භාෂ්කර විෂ්ම පාල වරුණන් ප්‍රේතාදිපාදී ග්‍රහං
ප්‍රච්චුන්ඩෝ නල කුබරක් සුර ගජං චින්තාමනී කච්ස්තුතං
ස්වාමි ශක්ති හරස්වලත් බල දරත් උර්වන්තුතේ සර්ව මංගලම්

ගඟන තල මැද දිලෙන පුන් සද උඩට බැදි සොද උඩුවියන්
රුවට දෙපලට සොඳුරු විලසට අඳුර දුරු කරනා පහන්
වතට වගුරලි සතර කොන ඇති පෝරුවේ ඇති පුන් කලස්
යුවතිපතිහට මෙවැනි අස්නට දෙන්ට සැම දෙවියනි වරම්

ඉන් පසුව පහත සදහන් ගායනය ඉදිරිපත් කරනු මැනවි.

සද්ධාගුණ සුද්ධෝදන නරපති කුල මහිමං
බුද්ධාගම මහා මායා දේවීධර ප්‍රසූතං

විද්‍යාධර සකලාගම නිපුණා බහු පයීතං
ශ්‍රී ගෞතම දායා මුණි ප්‍රණමාමිත සරණං......

කීම් - "මා විසින් ආරාධනා කළ පසු ජයසක් මංගල බෙර මැද මනමාල මහත්මියගේ සහ මනාල මහතාගේ මාමාවරුන් මේ යුවතිපතීන් දෙදෙනා අතින් අල්ලා දකුණු පය පෙරටු කොටගෙන පෝරු මස්තකයට ගොඩ කරන්න...
මේ අවස්ථාවට පෙර ඒ සඳහා සුදුසු ගායනා ඉදිරිපත් කළ හැකිය.කෙසේ වෙතත් පෝරුවට පය තබන විට පිරිත් කීම යහපති.

## පෝරුව නැගීමට පෙර ගායනාවක්.

එදා ගෞතම මුනිඳු බුදුවූ මොහොතෙ මිහිකත ගුගුරමින්
සදා සත්තයේ බලය පෙන්වා දනන් හට සෙත් කල ලෙසින්
මෙදා පෝරුවෙ නගින්නට පෙර වරම් ළද මෙ පින්වතුන්
උදා කරගෙන ජයෙන් ජයසිරි තබනු මැන ඔබෙ පා කමල්

## පෝරුවට නගිනවිට ගායනා කරනු මැනවි

සබ්බීතියෝ විවජ්ජන්තු - සබ්බරෝගෝ විනස්සතු
මාතේ භවත්වන්තරායෝ - සුඛී දීඝායුකෝභව

භවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ බුද්ධානු භාවේන - සදා සොත්ථී භවන්තුතේ..

භවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ ධම්මානු භාවේන - සදා සොත්ථී භවන්තුතේ..

භවතු සබ්බ මංගලං - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ සංඝානු භාවේන - සදා සොත්ථී භවන්තුතේ..

ජයෝ මුනින්දස්ස සුබෝදි මූලේ
අහෝසි මාරස්ස පරාජයෝහී

උග්ගෝසයුං දේව ගනා පසන්නා
ඒතේන සච්චේන ජයස්සු තුය්හං

යංදුං නිමිත්තං අවමංගලංච
යෝවා මනාපෝ සකුණස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකංතං
බුද්ධානු භාවේන විනාස මෙන්තු...

යංදුං නිමිත්තං අවමංගලංච
යෝවා මනාපෝ සකුණස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකංතං
ධම්මානු භාවේන විනාස මෙන්තු.....

යංදුං නිමිත්තං අවමංගලංච
යෝවා මනාපෝ සකුණස්ස සද්දෝ
පාපග්ගහෝ දුස්සුපිනං අකංතං
සංඝානු භාවේන විනාස මෙන්තු..

**බුද්ධ**

සම්බුද්ධිත්තම මුදාර මනන්ත ඥාණං
සද්දන්ක දසබලං කරුණා නිවාසං
සක්කාර භාජන මහං ජනමග්ග නාහං
සද්ධාය බුද්ධ මසමං සිරසා නමාමී

**ධම්ම**

සත්තං දදං සුමසුරග්ග රසංරසානං
සත්තානු සත්ත පුරිසුත්තම සේවිතංයං
රාගාධිරෝග හරනේ සුරවා රිමානං
සද්ධාය ධම්ම මතුලං සිරසා නමාමී.

**සංඝ**

සංඝං ජිනානු මනුත්තර පුඤ්ඤා ඛෙත්තං
බ්‍රහ්මා මරාදි මහිතං විනීතං සහෝඝං
සික්කිත්තයා හරණෝ භූසිත මුත්ත මග්ගං
සද්ධාය සංඝමසමං සිරසා නමාමී.

බුද්ධෝ තිලෝක සරණෝ
බුද්ධෝ සුරියෝ තමෝනුදෝ
ඒවං තං සරණං ඛේමං බුද්ධෝ මේ සරණං වරං
ගච්ජාමි සරණං බුද්ධං නත්ථි තුය්හං භයං සදා

ධම්මෝ තිලෝක සරණෝ
ධම්මෝ සුරියෝ තමෝනුදෝ
ඒවං තං සරණං ඛේමං ධම්මෝ මෙ සරණං වරං
ගච්ජාමි සරණං ධම්මං නත්ථි තුය්හං භයං සදා

සංඝෝ තිලෝක සරණෝ
සංඝෝ සුරියෝ තමෝනුදෝ
ඒවං තං සරණං ඛේමං සංඝෝ මේ සරණං වරං
ගච්ජාමි සරණං සංඝං නත්ථි තුය්හං භයං සදා.

## මංගල පෝරු අෂ්ඨක

සම්මා සම්බුද්ධ ඥානේන
සම්මා සම්බුද්ධ දේශනා
සම්මා සම්බුද්ධ ලෝකස්මිං
සම්මා සම්බුද්ධ තේ නමෝ

සම්බුද්ධ මුත්තම මුදාර මමංත ඥාණං
සත්ත උත්තමං දසබලං කරුණාදි වාසං
සංඛාර භාජිත මහා ජන මණ්ඩලා සං
සද්ධාය බුද්ධ මසං මං සිරසා නමාමී

මේරුන් විරාජිත සමන් විය බුද්ධ රාජං
ශ්‍රී දන්ත සාගර සමන් විය ධම්මරාජං
සත්කූල පබ්බත සමං විය සංඝ රාජං
ශ්‍රී බුද්ධ ධම්ම ගුණ සංඝ වරං නමාමී

## ගායනාවක්

විල් තෙරේ මැද මල් ගැබේ තුල උපන් පද්මාවතී උතුම්
සිල් බලේ වැඩි බෝ සතුන්ගේ අණට බිහිවුණු අනුහසින්
කල් බලා බරණැස් පුරේ නිරිඳුන්ට පාවා දුන් බලෙන්
පුන්කලස් සිව් කොන තබාලා දෙදෙන පෝරුවෙ සිටුවමින්

(මෙම ගායනය පෝරුව නැගීමට පෙර හෝ පෝරුව නැංග විට අවස්ථානුකූලව ගායනා කරයි.

## කීම්

“හොදයි අදින් ආරම්භවන මේ යුග දිවිය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා...උතුම් වූ බුද්ධාදී රත්නයන් මුදුන්පත් කරගෙන..තිස්තුන් කෝටියක් දෙව් දේවතාවුන් වහන්සේලා ආශිර්වාදය ආරක්ෂාව නිබඳව නිරතුරුව ලැබේවා යැයි සිතාගන තුණුරුවන් ප්‍රධානව ඉෂ්ඨ දේවතාවුන් වහන්සේලා නමින් මේ බුලත් වෙන් කරන්න...
( කියා බුලත් දෙදෙනාට දී නැවත අරගෙන උස් ස්ථානයක තැබීම හෝ යහන් උඩුවියනේ තැන්පත් කරන්න)

“හොදයි මී ලඟට ඔබ දෙපලගේ පෙර හත්මුතු පරම්පරාවේ නමින් බුලත් පඩුරු වෙන් කිරීමයි දැන් සිද්ධ කරන්නෙ....එනම් අත්තා ,මුත්තා,නත්තා,පනත්තා,කිත්තා,කිරිකිත්තා,කිරිකෑමුත්තා කියන්නාවූ.. එවන් පරම්පරාව වෙනුවෙන් මේ බුලත් හුරුළු චාරිත්‍රයක් වශයෙන් වෙන් කිරීමයි. (බුලත් අත් වෙන් කරන්න)

මහා කාරුණිකෝ නාථෝ
හිතාය සබ්බ පාණියං
පූරෙත්වා පාරමී සබ්බෙ
පත්තෝසං බෝධි මුත්තමං

"....යනාදීන් කියා සිද්ධාර්ථ කුමාරයාණන් වහන්සේ සහ යශෝදරා දේවීන් වහන්සේ එරන් පෝරු මස්ථකයෙහි වඩා හිඳුවමින් සදෙව් ලොවට අධිපති ශක්‍ර දේවේන්ද්‍රයාණන් වහන්සේ අහසට අතපොවා එරන් සළුවක් ගෙන යශෝදරා දේවීන් වහන්සේගේ සිහිනිඟ බඳවා හිස සිටන් පාදාන්තය දක්වා ස්වර්ණාභරණයෙන් සරසවා ගෙන ඊශ්වර මහා රාජෝත්මයාණන් වහන්සේ එරන් කරඬුවේ සගවා තිබූ පිරිත් හුය ගෙන ඔවුන් දෙදෙනා වහන්සේගේ දෙසුළැඟිලි බැද මහා සහම්පතී දිව්‍ය රාජෝත්මයාණන් වහන්සේ එරන් කෙන්ඩියෙන් පැන් ධාරා වත්කොට ඔවුන් දෙදෙනා වහන්සේ අභිවෘද්ධියට පැමිණ වූ සේක.....ෲ
ඒ ආනු භාවයෙන් .....ෲ අදත් මේ යුවතිපතීන් දෙදෙනා රන් රිදී මුතු මැණික්...ශංඛ සීල ප්‍රවාලයා දී දස විද රත්නයන්ගෙන් ආඪ්‍යව රවි..චන්ද්‍ර...කුජ....බුධ...ගුරු..ශුක්‍ර...ශනි...රාහු...කේතු.. යන නවග්‍රහ දිව්‍ය සමූහයාගෙන් වන්නාවූ අපල උපද්‍රවයන් නිවාරණය කොට...ෲ අට අනූවක් රෝග... එකසිය අටක් ව්‍යාධීන් විද්වංශනය කොට උතුම් වූ ජය මංගල්‍යයක් වේවා.....ෲ

## මංගල පෝරු චාරිත්‍ර කීම්

කෛලාසේ හේමකූටේ මන්දිරේ මේරුසින්නේ
පාතාලේ වෛකලන්තේ සිද්ද ගාන්ධර්ව ලෝකේ
බ්‍රහ්මාණ්ඩය විෂ්ණු භවනේ පසුපති නිලයේ
චන්ද්‍ර සූර්යා තතොස්මිං සර්වර්ත සිද්ධියං
විමල සුමනයෝ මංගලන්තේ දිගන්තු...ෲ

අප ශ්‍රී සද්වාර චක්‍රවර්ති අංගී රස ශ්‍රී සිද්ධාර්ථ ගෞතම සර්වඥ ඥාන රාජෝත්තමයාණන් වහන්සේ සාර සංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරමින් බුදුවන්නට යන ආත්ම භවයකදී කිඹුලවත් නුවර සුද්ධෝදන රජතුමාට ජාතව මහාමායාදේවීන් වහන්සේ කුස පිළිසිඳ... දස මස ඇවෑමෙන් පසු මැණියන් හට කිසිදු ආයාසයක් නොකරම්හයි සිතා වෙසඟ මැදි පොහෝදා කුජ දින වීසා නැකතින් මහා බ්‍රහ්මයාගේ දෝතෙහි තිබූ.. එරන් දැලට බිහිව

දිනෙන් දින මෝරන පූර්ණ චන්ද්‍ර කලාපයක් මෙන් සැදී සොළොස් හැවිරිදි වයස ලත් තැනදී යශෝදරා දේවීන් වහන්සේ කරකාර බදිම්හයි සිතා....

**..චක්‍රාර්ති බ්‍රහ්ම නයනේ පුල්වන් මහේස්වි නිත්‍යං යශෝදර නිති ජින පබ්බදානං......**

**......තවද යනු කී හෙයින් විෂ්ණු බ්‍රහ්ම සියාම සන්තුසාදී සියළු දෙවියෝ මේ මඟුල් සක්වලට රැස්ව සිද්ධාර්ථ කුමාරයාණන් වහන්සේගේ මංගල්‍ය පිණිස මඟුල් මණ්ඩපයක් තනමැයි සිතා... නිල් සුදුපට වස්ත්‍රයෙන් .....උඩු වියන් බඳවා පයට පරසතු මදාරා ඇඹුල, උපුල්, ඕලු, නෙළුම්, සපු, නා පනා, කොබෝලීල, ඉද්ද . පුලිද්ද, සව්කෙන්ද.. ආදියෙන් මල් දම් පතුරුවා දෘත... රාෂ්ඨ... විරූඪ... විරූපාක්ෂ... වෛශ්‍රවණ කියන්නාවූ සතර රජ දරුවන් සතර කොන සිටුවා පෝරුව ඒ පිට තබා වට වස්ත්‍රයකින් වසා අන්තරීරාක්ශ විමානයෙහි වාසය කරන්නාවූ අනගාරික අසුරේන්ද්‍ර ..සනී සෙම අමර මන්ත්‍රී කියන්නාවූ නව ග්‍රහයින් වට පිරිවරා ආයුධ අටක් අටකොන සිටුවා .......මහා කාරුණිකෝ නාථෝ හිතාය සබ්බ පානීනං පුරෙත්වා පාරමී සබ්බා පත්තෝසං බෝධි මුත්තමං....ශ්‍රී කියන වදනද කියමින් දෙදෙනා වහන්සේ අභිවෘද්ධියට පැමිණ වූ සේක.**

**ශ්‍රී...තවද දෙදෙව් ලොවට අධිපති ශක්‍ර දේවේන්ද්‍රයාන් වහන්සේ අහසට අතපොවා එරන් සළුවක් ගෙන යශෝදරා දේවීන් වහන්සේගේ සිහිනිඟ බඳවා හිසේ සිට පාදාන්තය දක්වා ස්වර්නාභරණයෙන් සරසා ඉෂ්වර දිව්‍ය රාජෝත්තමයාණන් වහන්සේගේ රන් කරඬුවේ තැන්පත් කර තිබූ දිව්‍ය මය පිරිත් ගෙන දෑඟිළි එක්කොට බැඳ සහම්පතී මහා බ්‍රහ්ම රාජෝත්තමයාණන් වහන්සේගේ එරන් කෙණ්ඩියෙන් පැන් ධාරාවක් වක්කොට සිදුහත් යශෝදරා සරණ මංගල්‍යය කළා වූ බලයෙන් යුවතිපති හට ජය මංගල්‍යයක්ම වේවා...**

## ඉෂ්ඨ දේවතාවුන් වහන්සේලාට දළුමුර පිදීම

නාග ලොවින් මුනිඳු පුදට ගෙනාව දළු මුර
නාග වල්ලි යැයි කීවේ අපගේ මුරහන
සම්මා සම්බුදු නැමදා තෙරුවන් මංගල
ඉෂ්ඨ දේවතා උදෙසා පුදමුය දළුමුර......

- ඉන් පසුව මනාලයත් මනමාලියත් බුලත් හුරුළු මාරු කිරීම හෙවත් බුලත් හුරුළු දැමීම සිදු කරනු ලබයි .මේ සඳහා බුලත් හතක් එක් අයෙක් දැමිය යුතු බව විශ්වාසය වන අතර වර්ථමානයේ ඒ වෙනුවට බුලත බැගින් බුලත් හතක් දමනු ලබන අවස්ථාද ඇත.

- **සළු පැළඳවීම**

ශාස්ත්‍රාගම ධාරී ගුණ -ඥාණ සම්ප්‍රයුත්තං
ලෝකංචාරී ව්‍යාංජනා -විජ්ජා චාරං
විජ්ජාචාරේ මනුෂ්‍ය-සේවිතං නිත්‍යං
සරස්වතී දේවීෂ්වර -ආසනප්‍රං විස්තං

සිත බැඳුණු ආලය - පවසන්න කෙලෙසය
නොවී දැන් කෝලය - අන්දවන්නකො සේලය

- **මාලය හෝ තැල්ල බදින අවස්ථාවට කවියක්**

මනමාල මහත්මියට මනමාල මහතා විසින් පළඳවනු ලැබේ.

නෑදෑයින් සමග සිටිමින සිතු ලොල්ලේ
හදවත් දෙකක් එක් වී ඇත සැනසිල්ලේ
අපහැම දෙනාගෙන් ආසිරි ලැබ ලොල්ලේ
රන්මාලය බදිනු මනමාලිගෙ බෙල්ලේ

මොහොතින් මොහොත ලංවෙනවා සුභ කාලේ
කෙතරම් පියකරුද මේ දෙදෙනගෙ ආලේ
තව තව වැඩිවන්න දෙදෙනාගේ බැදි ආලේ
කුමරිට පළඳන්න ඔය මංගල මාලේ

නවබර සිතුම් කැටිකරගෙන නව තාලේ
කෙතරම් වටිනවද මේ සුන්දර කාලේ
තව තව වැඩිවන්න දෙදෙනගෙ බැඳි ආලේ
කුල කුමරිට පලදන්න මේ මංගල මාලේ

## මුදු මාරු කිරීමේ අවස්ථාව සඳහා කවි

හැමදා නිතර ඇති කරගෙන හද මෘදුව
ජීවිත කතර ගෙන යන්නට එක මුතුව
අප හැම දෙනා ගෙන් ආසිරි ලැබ පොදුව
දැන් අවසරයි දැමුමට මංගල මුදුව

අවටින් ඇසෙන්නේ මංගල ගී සද්ද
මේ දෙදෙනාට කෙතරම් සතුටක් ඇද්ද
එක්වන්නට සද ලෙසිනි පෙම් බැන්ද
කුමරිට පළදන්න මේ මංගල මුද්ද

නව ආලෙකින් ගෙන ජීවය මග කැටුව
සෙනෙහස සතුට ජීවිතයට ගෙන ලදුව
නොවෙනස්වන ලෙසට සැමදා හද පිදුව
ආදර කුමරුටයි මේ මංගල මුදුව

මංගල මුදුව පළදා
යුග දිවි එකලු කළ දා
දිවි ඇති තෙක්ම සැමදා
සිටිනු දෙසිතම එකට බන්දා

මනමාල මහතාගේ දකුණු අතෙහි වෙඳ ගිල්ලට මනමාල මහත්මිය විසින්ද ,මනමාල මහත්මියගේ වම් අතෙහි වෙදගිල්ලට මනමාල මහතා විසින් පැළඳවීම සිරිතය.

.

- **බන්ධනය**

මනමාළ මහත්මයාගේ වම් අතේ සුළැඟිල්ල ද, මනමාල මහත්මියගේ දකුණු අතෙහි සුළැඟිල්ලේ ද, එක්කොට පිරිත් හුයෙන් (නූලෙන් ) බඳිනු ලබයි. පසුව රන් කෙන්දකින් හෝ නූලකින් බැඳීමද සිදු කරනු ලබයි.මෙය පෝරු චාරිත්‍රයක ඉතා වැදගත්ම අංගයකි. එහිදී පහත සදහන් ගාථා ගායනා කරනු ලැබේ.

සබ්බේ බුද්ධා බලප්පත්තා පච්චේ කා නඤ්ච යං බලං
අරහන්තානඤ්ච තේජේන රක්ඛං බන්ධාමි සබ්බසෝ....

(මෙම ගාථාව තෙවරක් ගායනා කරනු ලබයි.)

- **අතපැන් වැක් කිරීම.**

අත පැන් වැක්කිරීමේදී පහත සදහන් ගාථාව ගායනා කිරීම සිරිතකි

ජයන්තෝ බෝධියෝ මූලේ -සක්‍යානං නන්දි වද්ධනෝ
ඒවං තුය්හං ජයෝ හෝති -ජයස්සු ජය මංගලං
(මෙය තුන් වරක් ගායනා කරනු ලබයි)

**මෙම සුභ අවස්ථාවේදී ජයසක් මැද මංගල බෙර වාදනය කරනු ලැබීම සිරිතකි.**

- **ජයමංගල ගායනය.**

ජය මංගල ගායනා කරනබාලිකාවන්ට ආරාධනා කර ඔවුන්ට අවස්ථාවක් සලසා දීමත් ,මනමාලමහතා විසින් ඒ සදහා තුටු පඬුරු ලබා දීමත් සිදුකරනු ලැබේ.

උදා- බාහුං සහස්ස මභිනිම් ............

- ## කච්චිය දීම සහ දෙමහල්ලන්ට සහ නෑදෑයින්ට බුලත් දීම

මනමාලියගේ මව පෝරුව ළගට කැඳවා සූදානම් කර ඇති කච්චියට කවි සහ කීම් කියනු ලබයි.

ඔක්කාක රජකල..
සුබ්‍රහ්ම යැයි නම් කල..
නායක බමුණු කුල...
තමයි බ්‍රහ්මාභිසේකයේ මුල...

සුබ්‍රහ්ම කියනා
බමුණෙකු එගම වෙසෙනා
සෝමසිරි කියනා
කුමර බමුණට දාව උනා.........

මෙසේ වැඩෙනා කළ
සරණක් සොයා නිසි කළ
බ්‍රහ්ම නායක කුල
කුමරි කුමරුට පවා දෙන කල........

අනෙක දුක් වින්දා
පුතණුවනි මෘදුව සන්දා
දෙතනෙ කිරි කන්දා
මගෙන් කොපමණ බොන්ට ඇද්දා........

මව් පියවරුන් හට
දරු දුකට සම වන්නට
උපමා කරන්නට
දෙයක් මිහිපිට ඇත්ද කිව මට.....

බොහොම දුක් වින්දා
බමුණු කුමරුට එකලා
මව් තුමට වැඳලා
කීය වදනක් මෙසේ තෙපලා.........

මව් තුමණී දුවහට
දෙව් දෙතනෙ ලේ කිරි කොට
පෙවූ ගණනක්ය මට
අනේ දැන්වත් කියන් මට.......

දුවට දුන් කිරිනම්
මැනලා නැතේ මානම්
පුතණුවණී එනිසා දැන්
ගණන කෙලෙසක පවසම්ද මන්.....

පුතණුවනි එනිසා
කිරි දුන් ගණන කෙලෙසා
උපමා කර යසා
කියම් වදනක් මෙසේ තෙපලා.......

දස මස එකඩ සරී
උපන් දා සිට දුන් කිරී
කච්චියක් රෙදි සරී
තෙමෙන්නට ඇත දුවට දුන් කිරී.....

එවිට එම කුමරුන්
රෙදි කච්චියක් විගසින්
ගෙන්වාගෙන තොසින්
මවට පිළිගැන්වීය සතොසින්..

රන් හෙප්පු ගත්තේ
එහි පිට තබා නිත්තේ
මවට දුන් සත්තේ
එදයි කිරිකඩ ලොව පැවැත්තේ

රනින් කිල්ලෝටෙයි
ඇමිණූ එරන් කෙන්දයි
රන් ගාපු ගිරයයි
තබා කිරිකඩ රෙද්ද පිදුවයි......

රෙදි කච්චියක් පොගවන්නට තරම් වන
කිරිදුන් මගේ අම්මේ දෙව් දුවක් වන
හද බැදි මගේ සැමියාගෙන් වෙතින් දෙන
තිළිණය පිලි ගන්න අයැදිමි දෙදන ඇන

සදා දරුවන් බාල කාලෙදි මව් පියන් දුක් විදිති නිරතුරු
සොදා ලෙස අභරණ පළන්දා නොයෙක් සුරතල් බලත් මව්වරු
එදා එලෙසට පැසුණු මා අද යුග දිවියකට යාමි නිරතුරු
මැණියණි ඔබේ දෙපා වදිනට දෙන්ට අවසර සමාවී ගරු

දස මාසේ උරේ කත්වා
පෝසෙසි උද්ධි කාරණං
ආයූ දීසං වස්ස සතතං
මාතු පාදං නමා මහං..

පහත සදහන් ආකාරයේ, මවට කියනු ලබන කවි පවතින වෙලාව අනුව ගායනා කල යුතුය.

දෙවෙනි බුදුන් ලෙස කියමින් ලොවම පිදූ අම්මා
නම්මාගෙන දෙතන පුරා රස කිරි පෙව් අම්මා
අම්මේ ඔබෙ ගුණ කීමට මට නම් බෑ නිම්මා
සම්මා සම්බුදු වනදා නිවන් දකින් අම්මා

ලේ ටික කිරට හරවා මා හට පෙව් මගෙ අම්මා
දිව රෑ නොබල මා වෙනුවෙන් වෙහෙසුන මගෙ අම්මා
මැදියම් රැයෙත් දෝතට ගෙන නැලෙව්වාලූ අම්මා
බුදුන් දැක නිවන් දැකපන් ආදර මගෙ අම්මා

ටික ටික වතුර අරගෙන පොල් කටුවකට
නාවපු අයුරු මතකයි ඇගෙ උකුල පිට
අම්මේ ඔබේ පා පියුමන් සිඹින විට
වැටෙනවා කඳුළු මගෙ දෑසින් ඔබෙ නමට

උයලා බත බිමට බෑ හැටියෙම වාගේ
බෙදලා පිගානෙට දෙන රන් තැටිය මගේ
වෙනදා වගේ නොවෙයි අම්මේ බත රස්නේ
කියපු ගමන් මට කැව්වා අම්මා මගේ

මුහුදේ නැව පෙරළුණු දා බෝසත් තම අම්මා
මතකයි කරපිට තියමින් පීනා ගොඩ දැම්මා
බුදු වන්නට මතු භවයෙදි විවරණ දුන් අම්මා
යන්න අවසරයි දූ හට අවසර දෙන් අම්මා

අම්මේ ඔබ චූටි දෝණි අද දීගෙක යනවා
ගෙදර හිටය මැනික් පහන වෙන පුතෙකුට දෙනවා
ගේ පාළුයි හිත පාළුයි හදවත කකියනවා
දුවගෙ අනාගතේ හිතලා සතුටු කඳුළු එනවා

(මනමාල මහත්මියගේ මව විසින් එම කච්චිකිරිකඩය රැගෙන යාම සිරිතය.මෙම අවස්තාව හැඟීම් බර සංවේදී අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකිය. ගායනා ඉදිරිපත් කල යුතු වන්නේද ඉතා සංයමයකින් බව සිහිපත් කළ යුතුය.

## මනමාලියගේ පියාට කියන කවි.

දෙපා ඔසවන කුඩා අවධියෙ පටන් මේවනතුරු දයාවෙන
සොයා දුක සැප කුදුමහත් හැම දෙවා රසවදනින් අමාවෙන
මෙමා අද යුග දිවියකට පත්වෙමින් යන්නට සිද්ද වූයෙන
පියාණෙනි ඔබෙ දෙපා නමදිමි දෙන්න අවසර සමාවීමෙන

මොනයම් කරදර ආවත් මගෙ හිතට වැදී
මගෙ පියතුම දුන් ඔවදන  අදත් මට මදී
එපිං බලෙං මගේ පිය හට නිවන් මඟ දිදී
සිහිකරනෙමි දිවිය  පුරා මගේ පිය වදී

පෙරයම් දවසක මා ලැබු මගෙ  පිං හින්දා
මගෙ පියතුම මට ලැබුනේ ඒ  ගුණ හින්දා
පිං තිබුණා සසර පුරා කල  හොද හන්දා
සත්තයි මම නම් අද දින හරි  සතුටින් දා

- **මංගලම් ආශීර්වාද කවි**

සුද්දසුන් නිරිදුන්ට දාවූ  එ සිද්දත්  කුමරුන් උතුම්
වැන්ද මණ්ඩල කිඹුල්වත් පුර නුවර ඉපදුණු  අනුහසින්
යුද්ද කරලා පැරදි වසවතු ගියේ දස  පෙරුමන්  බලෙන්
බුද්ධ රත්නේ අනුහසින් වෙයි මොවුන් හට ජය  මංගලම්.

පොරණ දීපංකරව මුණි රජ එදා  විවරණ  දුන් බලෙන්
දෙරණ පවතින බුද්ධ පූජා මෙලෙස පැවතුණ  අනුහසින්
කරන සටනින් පැරද වසවතු ගියේ දස පෙරුමන් බලෙන්
දම්ම රත්නේ අනුහසින් වෙයි මොවුන් හට  ජය මංගලම්

වංක ගිරියේ තපස් රකිනට ගියේ අපෙ  මහ බෝසතුන්
නැංග රථයත් අසුන් දෙදෙනත් අතර  මඟදී දනට දුන්
රන්ද රිදියෙන් මුතු මැණික් සහ සියළු  වස්තුව දනට දුන්
සංඝ රත්නේ ආනුභාවෙන් මොවුන්  හට ජය මංගලම්

- **සෙත් කවි**

**පෝරු චාරිත්‍ර සදහා වෙන් වී ඇති කාලය පිලිබද අවබෝධයෙන් සෙත් කවි ගායනා කිරීම යහපතිය. ඒ අනුව පහත සදහන් ගායනා ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.**

## විෂ්ණු දෙවියන්ගෙන් ශාන්තියක් ලබා ගැනීමට.

අඹර විල බෙලි වනය ගජ කුඹු තලය විසි සිරිකතැති උර මත
අමර පති වෙණු රදුනි මෙයැදුම අනුව යොමුකර ඔබගෙ යුග නෙත
ගැඹුර නර සහ අපල දුරු කර විලස පිණි කැට පරිදි අලපත
මොවුන් දැක සලසවනු මැණ නිති නිතර දියුණුව සමග සුභ සෙත

## සමන් දෙවිදුට

සිසර කර බඳු නොමඳ පිවිතුරු කුළුණු ගුණයෙන් වොරැදි සිරිමත්
අඹර ගැබ සැරිසරණ වරණිඳු පිටට නැඟ පෙර සිටම කවදත්
පවර තර ගරු සුමන සුරිදුනි ඉවර කර ග්‍රහ අපල බලවත්
මොවුන් දෙදෙනගෙ දියුණ තරකර තවද ගෙනදෙනු සැමදා සුබසෙත්

## පත්තිනි

තෙදන බලමැයි සිතුව පුරදර මහළු වෙසකින් වැඩ එදා
අඳුන ගිර මැඩ කිරම ජලයෙන් රැගෙන ගිනි පිදුවෙන සදා
සොබන පත්තිනි මව්ණි කුළුණැස යොමා ම කියන බස ලෙදා
තිබෙන වස් දොස් මුදා හළ මැන දියුණුවෙහි මඟ කර උදා

## කතරගම දෙවිදුට

දකුණු දිඟෙහි දේවාලය කඳුහත නිරතුරු සුරකින
මුහුණු සයැති කඳ සුරිදිනි යොමුකර බරනෙත කුළුණින
යෙදුනු අපල උවදුරු සහ රුපු බිය කරදර පැමිණෙන
විසුනු කරල මේ දෙදෙගෙ මතු දියුණුව සලසනු මැන

## ඊෂ්වර දෙවිඳුට

අසුර කැළ නෙත් අඟින් බැලුමෙන් නසා ලූවේ සැබැ විනේ
විතර නොව තෙද විකුම් බලයෙන් සුදන හට සෙත සදමිනේ
ළතර පින් පිඩු තවුස් බැව්ලත් මෙහෙසරාණන නිසි මෙනේ
පතර සිරි සැප සදනු දෙදෙනට දියුණ සැලසෙන විලසිනේ

**කීම් - "අද දින සුභ මුහුර්තියට මංගල පෝරුවට නංභවා සිංහල සිරිතට අනුව කිසිම අඩුවක් නොවන ලෙස චාරිත්‍ර කරවා.... සරණ පාවා... පෝරු චාරිත්‍රයේ අවසන් මංගල කටයුත්ත වන්නේ මේ වාසනාවන්ත යුවතිපතීන් දෙදෙනා සුබ නැකතට පෝරු මස්තකයෙන් බැස්සවීමයි.මේ අවස්ථාවේදී මනමාල මහක්මියගේ මාමා කෙනෙකු විසින් මෙතන සූදානම් කර ඇති පෝල් ගෙඩිය බිදින ලෙස ගෞරවයෙන් ආරාධනා කරනවා.....**

- **පෝරුවෙන් බැස්සවීම**

රන් පනන් පට පඩුරු දළුමුර ඔප්පු දී ජය මංගලම්
සන්තොසින් මේ පුද දිවැස් ලා සිව් වරම් දෙවි මංගලම්
ගන්ට දළුමුර සිටින නෑයෝ පිරිවරා දෙවි මංගලම්
පෝරුවෙන් බැස යන්ට දෙදෙනට වේවා ජයසිරි මංගලම්

(මංගල බෙර මධ්‍ය යේ යුවතිපතීන් දෙදෙනා පොරුවෙන් බස්සවන්න.ඒ අවස්ථාවට සබ්බීතියෝ විවජ්ජන්තු....ගාථාව ගායනා කල හැකිය)

**අනතුරුව යුවතිපතීන් දෙදෙනා විසින් සකස්කර ඇති මංගල පහන් දැල්වම සදහා අවසර ලබා දිය යුතුය.ඒ දෙදෙනාට ආරාධනා කිරීම චාරිත්‍ර ශිල්පියා විසින් සිදු කල යුතුය.**

**මින් පසුව සිදුවන දේ සදහා උපදෙස් අවශ්‍යානම් පමණක් ලබාදීම යහපති.විශේෂයෙන් පැමැණෙන සිටින දෙනාට ආචාර සමාචාර කිරීම,සකසා ඇති මංගල අසුනෙහි වාඩිවිම යනාදිය ඔවුන් සිදුකරනු ඇත.**

**පහත සදහන් උපදෙස් කවි පවතින සීමිත කාලය අනුව යුවතිපතීන් හට මංගල පෝරුව මත දී හෝ මංගල යුවල මඟුල් ගෙදරින් නිකම යාමට සුදානම් අවස්ථාවකදී හෝ සුදුසු අවස්ථාවකදී ගායනා කිරීම වැදගත්ය.**

## උපදෙස් කවි

ගතකළ යුගය හබලක් නැති ඔරුව වගේ
නිම වී අළුත් යුගයක සුභ නිමිති නැගේ
ආදර පුතණුවනි ඔබ හදවතය ඇගේ
ඇය උල්පතය ඔබෙ ආදර සුවය ගඟේ

පාගා නොගොස් දියඹට රළ පතර මැඩ
නැතිනම් නොපාගා විල්තෙර රුදුණු මඩ
පියවර නෙමැන ලැහැබක කටු පදුරු උඩ
නොලැබේ අපට හොඳ හොඳ මල් නෙළන ඉඩ

බුදුන් දහම් සඟුනට නිති ගරුකරනු
දන් සිල් භාවනාවට සිත යොමු කරනු
දෙමව් පියන් ගැන නිතරම සිත යොමනු
මේවා සිතටගෙන නිතරම කල් හරිනු

(මංගල අවස්තාවන්හිදී ගායනා කිරීම සදහා කාව්‍ය ශේඛරයෙන් උපුටා ගන්නා ලද උපමා කවි කිහිපයක් පහතින් දැක්වේ).

පියතුමා සොඳවා - දෙනෙතේ කඳුළු රදවා
දුව ළගට කැඳවා - මෙසේ අවවාද කී සොඳවා

නොකියා තම හිමිට - දමලා වස්ත්‍ර ඇඟ පිට
ගමන් ඉක්මන් කොට - නොයන් නුඹ වසනා ගෙයින් පිට

ඔබගෙ හිමියා නැති තැන - හැර නොයන් වෙන පිරිමින
යතොත් ඔහු දැනගෙන - කතා නොකරන් නුරා නෙතඟින

හිමි නෑ හටද ගරු - පැවතුව ලෙසින් ගරු සරු
නොකරනු වැඩ නිසරු - කරව යහපත් සේම නිරතුරු

නිති ගේදොර ඇමද - කැලිකසළ දැක නොමඳ
උදාසන සවස ද - පහන් දල්වනු නිබඳ

හිමි ගමනක් ගොසින් - ගෙට ආ කලට සතොසින්
නොතලවා මනසින් - සනසවන්කො සතුටින්

නොකරතොත් වියදම් - කරතෝත් ඉතා වියදම්
කියමින් ඇත් පදම් - රහස දනවන් හිමිට කර පෙම්
හෙට පසු කොට ඇමට - අළුයම පළමු නැගී සිට
හිමි පුබුදින කලට - ළඟම සිටිනේය රැකවල් කොට

# හිස වෙස් බැඳීමේ මංගල්‍යය

## හැඳින්වීම

ආසියාවේ බොහෝ රටවල වෘත්තීමය වශයෙන් නර්තන ප්‍රගුණ කල ශිල්පීන් විෂයෙහි පවත්වනු ලබන චාරිත්‍ර වාරිත්‍ර හා උත්සව කිහිපයක් තිබේ. එයිනුත් ඔවුහු ප්‍රථම වරට ප්‍රසිද්ධ වේදිකාවක මංගල උත්සවයක් සේ සලකා කටයුතු කරති. මෙම අවස්ථාව එකී ශිල්පීන්ගේ ජීවිතයේ ඉතා වැදගත් සිහිවටනයක් බව නොකිවමනාය. සංක්‍රාන්තික මොහොතක් ලෙස සඳහන් කල හැකි මංගල නර්තන දැක්වීම ඒ ඒ රටවල ඒ ඒ නර්තන සම්ප්‍රදායට ආවේණික හැඳින්වීමේ විවිධ සංඥා නාමවලින් හඳුන්වති. මෙබඳු සංක්‍රාන්ති අවස්ථා සාමාන්‍ය ජන සමාජය තුල වුව ද දැකිය හැකි ය.

භික්ෂූන් වහන්සේ නමකගේ උපසම්පදා උත්සවය, ඉන්පසු කෙරෙන බණ දේශනය, මංගල බණ දේශන යනුවෙනුත්, දැරියක වැඩිවිය පැමිණි පසු ඒ වෙනුවෙන් කෙරෙන චතාවත් සම්ප්‍රදාය මල්වර මංගල්‍යය හෝ කොටහළු මඟුල යනුවෙනුත් ප්‍රථම සී සෑම, මංගල සී සෑම යනුවෙනුත්, අලුත විවාපත් වූ යුවතිපතීන් දෙදෙනා මධුසමයට පිටත්ව යාම මංගල ගමන යනුවෙනුත්, කිසිවෙකුගේ ප්‍රථම ගීත, කාව්‍ය, නවකතාව, ශාස්ත්‍රීය ග්‍රන්ථය එළිදැක්වීම දොරටවැඩුම වශයෙන් හෝ මංගල කෘතිය දොරට වැඩීම යනුවෙනුත් හැඳින්වීමෙන් මෙම විශේෂ අවස්ථාව "මංගල" අවස්ථාවක් හෙවත් ප්‍රථම, සුබ හෝ යහපත් අවස්ථාවක්ය යන්න විශද කෙරේ. නර්තන ශිල්පියෙකු සම්බන්ධයෙන් වුව මෙය පොදු සත්‍යයකි. එබැවින් දීර්ඝ කාලයක් තිස්සේ ශිල්ප හැදෑරූ උඩරට සම්ප්‍රදායේ ආධුනික කලා ශිල්පියා ප්‍රථම වරට නැකැත් චාරිත්‍රානුකූලව හිස වෙස් පැළඳීම හිස වෙස් තැබීමේ මංගල්‍යය නමින් හඳුන්වනු ලැබේ. මෙකී උත්සවය හිස වෙස් බැඳීම, වෙස් තැබීම, කළඑළි බැසීම, මඟුල් යක්කාරිය, වෙස් මංගල්‍යය, හිස වෙස් බැඳීමේ මංගල්‍යය, වෙස් පැළඳවීම, කළඑළි මංගල්‍යය ආදී විවිධ නම්වලින් හඳුන්වනු ලැබේ. මේ කුමන සංඥා නාමයකින් හැඳින්වූව ද ඉන් ගම්‍ය වන්නේ ආධුනික නර්තන ශිල්පියෙකු පළඳින සම්පූර්ණ වෙස් ඇඳුම

කට්ටලයෙන් සැරසී ඊට අදාල පූජා, චාරිත්‍ර ඉටුකර ප්‍රථම වරට නර්තන දක්වන මංගල අවස්ථාව එයින් හැඟවෙන බවයි.

මෙම විශේෂ උත්සව අවස්ථාවෙන් පසු හෙතෙම වෙස් නර්තන ශිල්පියා (ව්‍යවහාර බසින් නම් වෙස් නැට්ටුවා) යන නමින් හැඳින්විය හැකි අතර ඊට පෙර ඔහු හැඳින්විය යුත්තේ නෛයන්ඩි නර්තන ශිල්පියා (ව්‍යවහාර බසින් නම් නෛයන්ඩි නැට්ටුවා) යන නමිනි.

මෙකී මංගල උත්සව අවසානයේ ඔහුගේ ද දායකත්වය ඇතිව ස්වකීය ගුරුවරයා විසින් සංවිධානය කරනු ලබන ප්‍රථම කංකාරි නර්තන අවස්ථාව වෙස් බැඳි කංකාරි හෝ කලඑළි මඩුව නමින් හෝ හඳුන්වනු ලැබේ.

පූර්වෝක්ත අවස්ථාව පහතරට හා සබරගමු යන උභය සමප්‍රදායන්හි ද අඩු වැඩි තරමින් දක්නට ලැබේ. පහතරට සම්ප්‍රදායන්හිදී එය මඩු බැසීම, කලඑළි බැසීම, කලඑළි මඟුල වැනි නම්වලින් හඳුන්වන අතර සබරගමු සම්ප්‍රදාය තුළ මඩු බැසීම හෝ කලඑළි බැසීම ගුරු වරම් දීම යනුවෙන් හඳුන්වති. භාරතීය නර්තන සම්ප්‍රදාය තුළ මෙකී අවස්ථාව අරන්ගේත්‍රම්, අරන්ගේතිතම්, මණ්ඩලී පූජා (භරත, කථකලී, මණිපූරි) වැනි සංඥා නාම වලින් හඳුන්වනු ලැබේ. නාඩගම්වල ප්‍රථම රංගනය ද නාඩගම් මඩු බැසීම නමින් හඳුන්වති. මෙහි දී අපගේ අභිප්‍රේරණය වන්නේ එකිනෙකට වෙනස් වූ චාරිත්‍ර වාරිත්‍ර වලින් උපලක්ෂිත පූර්වෝක්ත මංගල නර්තන ශිල්පීන් විෂයෙහි පවත්වනු ලබන හිස වෙස් බැඳීමේ මංගල්‍යය පිළිබඳ ලුහුඩු සටහනක් ඉදිරිපත් කිරීමයි.

### හිස වෙස් බැඳීමේ මංගල්‍යයේ මූලික අරමුණු

"මංගල්‍යය" යන විශේෂ පදයෙන් හඳුන්වන උත්සව අවස්ථා ලෝකයේ විවිධ ස්ථරයේ මානව සමාජ තුළ දක්නට ලැබේ. එය නොදියුණු යැයි කියන ප්‍රාථමික සමාජ සංස්ථාවල මෙන්ම, දියුණු යැයි කියන සමාජ සංස්ථා තුළ ද අඩු වැඩි තරමින් පවත්නා ප්‍රපංචයකි. මෙකී උත්සව අවස්ථාව වූ කලී ඉතා විශේෂ අවස්ථාවක් බවත්, ඒ මඟින් එතෙක් සමාජයේ යම් යම් කටයුතු නොකල පුද්ගලයෙකු විශේෂ වශයෙන් හෙවත් අලුත්, වෙනස්,

විශේෂ, සම්භාවනීය, සුදුසුකම් සහිත පුද්ගලයෙකු ලෙස සමාජයට හඳුන්වා දීමට අවස්ථාවක් උදාවන බවත් කිව යුතු ය.

විශේෂ ගුරුවරයෙකු යටතේ දීර්ඝ කාලයක් නර්තනය, ගායනය, වාදනය, මඩු සැරසිලි ආදී ශිල්ප ශාස්ත්‍ර හැදෑරූ ආධුනික නර්තන ශිල්පියා වෘත්තීය සමාජයට ගැලපෙන නර්තන ශිල්පයේ මුදුන් මල්කඩ වූ හිස වෙස් පැළඳවීමට තරම් සුදුසු ශිෂ්‍යයෙකු බව පසක් කර ගන්නා ආචාර්යවරයාට ඒ පිළිබඳ වගකීම හා යුතුකම් රාශියක් ඉටු කිරීමට තිබේ. තෝරා ගත් එවැනි සුදුසුකම් සහිත ගෝලයාට කොහොඹා යක් කංකාරිය හා තදානුබද්ධ ශාන්තිකර්ම වලට අදාල නර්තන ගායන හා වාදන ඉදිරිපත් කල හැකිය යන අදහස පොදු සමාජයට ප්‍රායෝගික වශයෙන් ප්රදර්ශනය කිරීම හා ඔහු හඳුන්වා දීම හිස වෙස් තැබීමේ මංගල්‍යයේ ප්‍රධාන අරමුණ වෙයි. ඒ සඳහා ඔවුන් වටා සිටින සක්‍රීය සමාජයේ හැම දෙනාගේම ආශීර්වාදය හා පිළිගැනීමට ලක් කරවීමත්, ඔහුට තෑගි බෝග ලබා දී ඔහුගේ හැකියාව දක්ෂතාව අගය කර හෙතෙම ධෛර්යමත් කිරීම එයින් අපේක්ෂිත තවත් අරමුණකි. ආධුනික ශිල්පියාගේ ශිල්පීය හැකියාව තම විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් ඉදිරියේ ප්‍රදර්ශනය කරවීමත්, තමා (ගුරුවරයා) විසින් ඉතා මැනවින් ශිල්ප ශාස්ත්‍ර ලබා දී දක්ෂ නර්තන ශිල්පියෙකු සමාජයට දායාද කළාය යන්න සමාජයට සන්නිවේදනය කිරීමත් යනාදිය එයින් අපේක්ෂිත අවශේෂ අරමුණු වන්නේය.

නර්තන විෂය ක්ෂේත්‍රයට අවතීර්ණ වන්නේ කායික මානසික සුදුසුකම් රාශියකින් උපයුක්ත "පූර්ණ" පුද්ගලයෙකු වීම වුවමනාය. ඒවායින් කොටසක් අදාල පුද්ගලයාගේ කේන්ද්‍රය අනුව ජ්‍යොතිශාස්ත්‍රයට අනුව සොයා බලන අතර වෙනත් ගැළපීම ගුරු ඇදුරන් විසින් සොයා බැලේ. ඒ සඳහා දේහ ලක්ෂණ විද්‍යාව අදාල කර ගනිති. මෙකී තත්ත්වය භාරතයේ වුව සක්‍රීය ලෙස පවත්වන අතර එය දීර්ඝ කාලයක් තිස්සේ අඛණ්ඩව පැවති සිරිත් සමුදායකි. "නර්තනය" ඉගැන්විය යුතු හා නර්තනය සඳහා නුසුදුසු වන්නේ කෙබඳු පුද්ගලයෙක් ද යන්න කොහොඹා යක් කංකාරිය, බලි යාග ශාන්තිය වැනි ශාන්ති කර්මවල කවිවලින් ප්‍රකට වේ. එකී ශාන්තිකර්ම සාහිත්‍ය තුළ ඒ බව ඉතා ප්‍රබලව දක්වා තිබේ. නූතනයේ වුව වෘත්තිමය තත්ත්වයන් හිදී මේවා සැලකිය යුතු බව මගේ අත්දැකීමයි.

නර්තනය ඉගෙන ගැනීම, නෛයන්ඩි නැටීම, හිස වෙස් බැඳීම, ශිල්ප දැක්වීම හා ජීවන වෘත්තිය ලෙස නර්තන විෂය ක්ෂේත්‍රයට අවතීර්ණ වීම ආදිය අතීතයේ ගුරු ගෙදර තුළ ගුරුවරයාගේ ඕනෑ එපාකම් මත ඉෂ්ට සිද්ධ විය. එහෙත් 1930 දශකයෙන් පසු එකී ගුරු ගෙදර අධ්‍යාපන ක්‍රමය ක්‍රමයෙන් ක්ෂය වී ගොස් නර්තනය අධ්‍යාපන ආයතනයන්හි අධ්‍යයන විෂය ධාරාවක් බවට පත්විය. පාසල්, කලායතන, පෞද්ගලික පන්ති හා විශ්වවිද්‍යාල තුළ නර්තනය ඉගැන්වීම ආරම්භවීමත් සමඟම ඉපැරණි චාරිත්‍ර චාරිත්‍ර ක්‍රම විධි, ඉගැන්වීමේ ශිල්ප ධර්ම හා න්‍යාය, හිස වෙස් තැබීම ආදී බොහෝ සංසිද්ධීන්හි බරපතල විශෝධනයන් සිදු විය. එකී වෙනස් වූ හෝ නවීකරණය වූ හෝ තත්ත්වය පැරණි ස්වභාවය හා සැසඳීමේ දී වඩාත් ශිථිල වී ඇති සෙයක් විශද වේ. චිරන්තන සමාජයේ හිස වෙස් බැඳීම එක් කුල ක්ෂේත්‍රයකට පමණක් සීමා වූවකි. ඔවුන්ගේ පරමාර්ථය වූයේ කොහොඹා යක් කංකාරිය ඇතුළු ශාන්තිකර්ම රඟ දැක්වීම ජීවන වෘත්තිය ලෙස තෝරා ගැනීමය. එහෙත් අද්‍යතන සමාජයේ හිස වෙස් බැඳීමේ ප්‍රධාන පරමාර්ථය ඊට ඉඳුරා වෙනස් වූවක් නොවේ ද?

ගුරු ගෙදර අධ්‍යාපනය තුළ ශිෂ්‍යයා විසින් ගුරුවරයාටත්, ගුරුවරයා විසින් ශිෂ්‍යයාටත් ඉටු කල යුතු, ඉටු විය යුතු යුතුකම් හා වගකීම් රාශියක් තිබුණි. ඒවා එක් අතකින් එකිනෙකා හා බැඳි "බන්ධනයක්" මෙනි. එහෙත් නූතන සංකීර්ණ වාණිජ සමාජය තුළ පූර්වෝක්ත අවස්ථා හා බැඳි සාධනීය ලක්ෂණ ක්‍රම ක්‍රමයෙන් ගිලිහී යන මඟ ලකුණු ද පෙනේ.

අතීතයේ ශිල්ප කෙරෙහි වැඩි අවධානය යොමු කල අතර ඒවා ලිඛිත සටහන් ලෙස ගැනීම සම්ප්‍රදාය විරෝධී ලෙස සලකන ලදී. එහෙත් වර්ථමාන තත්ත්වය ඊට ඉඳුරා වෙනස් නොවේද? කෙසේ වෙතත් හිස වෙස් තබා ස්වකීය දෙවන පියා මෙන් වූ ගුරුවරයාගෙන් ගුරුවරම ලබා ගැනීම වූ කලී ශිල්පියෙකුගේ ජීවිතයේ අතිශය වැදගත් සිදුවීමකි. එය සමාජයට ද වැදගත් සිද්ධියක් වන්නා සේම නර්තන කලා ඉතිහාසයේ කඩඉම් අවස්ථාවක් ලෙස ද සනිටුහන් වනු ඇත. මෙනයින් සලකන කල්හි පිරිමි දරුවන් සඳහාම වෙන්වූ හිස වෙස් තැබීමේ මංගල උත්සවය යනු ආධුනිකයා පූජනීය තත්ත්වයකට පත්වන අවස්ථාවකි.

නර්තන විෂය ප්‍රවර්ධනයේ දී  බොහොමයක් පාසල් වල සිසුන් සඳහා වෙස් තැබීමේ උත්සව  උත්සව සිදු කෙරේ. එවන් උත්සව වල දී  දුටු කරුණු අනුව වෙස් මංගල්‍යයක් බොහොමයක් පාසල් ඉතා සුළු කාලයක් තුළ කුමන හෝ නර්තන අංගයක් පුහුණු කරමින් මෙම මංගල්‍යයන් සිදු කිරීමට යත්න දැරීම කණගාටුදායකය. ඇතැම් දරුවන්ට නියමිත තාලයට දෙපා තැබීමටවත්, අත එසවීමටවත්, මන්ඩියට සිටීමටවත් නොහැකි අවස්ථා ද දක්නට ලැබේ. බොහෝවිට මෙම අවස්ථා මුදල් උපයා ගැනීම, ද්‍රව්‍ය ලාභ ලබා ගැනීම වැනි අවස්ථා බවට පත්ව ඇත. මෙය මුළුමනින්ම බැහැර විය යුතු කරුණකි.

## හිස වෙස් බැඳීමේ චාරිත්‍ර

ශ්‍රී ලාංකික අනනතාවය සුරකින සාම්ප්‍රදායික ශිල්ප කලාවක් ලෙස නර්තන කලාව හැඳින්විය හැකිය.මෙය පාරම්පරික උරුමයකි.අතීතයේ නර්තන ශිල්පය පුරුදු පුහුණු කිරීමට ගුරු ඇති එකම ස්ථානය වන්නේ ගුරු ගෙදරය.දරුවාගේ වෙලපත් කඩේ අනුව ඔහු නර්තන කලාව  හා බැඳෙන්නේක් ද යන්න හඳුනා ගනී.දෙමව්පියන්ගේ ඉල්ලීම මත හෝ පරම්පරාගත දායදයක් ලෙස පිය පුතු උරුමයෙන් දරුවා නර්තන කලාව බැඳි අත්දැකීම් ලබා දෙයි.තම දෙමව්පියන් විසින් කැවිලි පෙවිලි අඩුම කුඩුම සහිත කදක්,ගුරු පඬුරු සමඟ ගුරුතුමාට පිළිගන්වයි.ජන්ම පත්‍රය පරීක්ෂා කරන ඇදුරු තුමා ඒ සඳහා දරුවා ශිල්පය ලබා දීම සඳහා භාර ගනී.වර්ථමානයේ පංති කාමරයේ මෙන් නොව පළමුවෙන් ගුරුතුමා තම ගෝලයාට ලබා දෙනුයේ මානව දයාව පිළිබඳ අත්දැකීම්ය. ඉවසීම, විඳ දරා ගැනීම, ආත්ම විශ්වාසය, ශිල්පය සඳහා ගෞරවය, තෙරුවන් සරණයාම තුළින් හික්මීම, විනය ගරුක බව නර්තන කලාව බැඳි සියළුම භාණ්ඩ පූජනීයත්වයෙන් සැළකීම,තමා ජීවත්වන පරසරයෙහි පිරසිදු කිරීම,දෙමව් පියන් ,පිළිබඳ  විශ්වාසය හා ගරු කිරීම , අන් අයට ගරුත්වය ලබා දීම ආදී මානවීය ගුණාංග බොහොමයක් සංවර්ධනය වූ පසු  නර්තන පිළිබඳ අත් දැකීම ලබා දෙනු ඇත.

## නර්තනය හා බැදි කුසලතා සංවර්ධනය

මුලින්ම සිදු කරනුයේ ගුරු ඇසුරෙන් නර්තන කලාව හා බැදි පූර්ව අත්දැකීම් ලබා දීමය.ඇදුරු තුමා ජීවත් වන පරිසරය ,ගුරු ගෙදර ආව තේව කරමින් සහාය වීම ඉතා වැදගත්ය.ඇදුරු තම කංකාරියට හෝ ශාන්ති කර්ම සහභාගීවන විට තම ගෝලයා එක් කරගෙන යාම සිරිතකි.ඇදුරු ගේ සහ අනෙකුත් වැඩිහිටි ශිල්පීන්ගේ දස්කම් දැක ගැනීමට ඉඩ සලස්වනු ඇත. නර්තන ශිල්පය ඉගෙන ගැනීමට ආසාවක් ඇති වුවද ගුරුවරයා ගේ අවසරය ලැබෙන තුරු නර්තනය ඉගෙන ගැනීම තහනම්ය. බෙරය බර වුව ද කරේ එල්ලාගෙන යාමට ගෝලයා මැලි නොවෙයි. ගුරුවරයාගේ කඩහඩ අනුකරණය කරයි.ගායනා වල අලංකාර,තාල හොදාන් අවබෝධ කරගෙන මුමුණන්නට පටන් ගනී.අත්දැකීමෙන් අධ්‍යාපනය ලබාදීම නිසා සියළුම දේ වර්ථමානයේ මෙන් පොත පතට සීමා නොවී සදාකාලික මතකයේ රැදෙන්නක් බවට පත්විය

සුභ නැකතට නමස්කාරය පුරුදු කිරීම සහ එහි අර්ථය මැනවින් අවබෝධ කරදීම සඳහා කාලය ළගා කර ගැනීම ගුරුවරයා විසින් සිදු කරනු ඇත. .ත්‍රිවිධ නමස්කාර සහ දෙවියන් වෙනුවෙන් පූජාවන් පවත්වා මෙය සිදුකරනු ලබයි.

නර්තනය හා බැදි මුල්ම දණ්ඩි සරඹ සිදු කරනු ලබන්නේ ගුරු ගෙදර හෝ කමතේ වීම අතිතයේ චාරිත්‍ර යකි. එයට හේතුව වන්නේ සෞභාග්‍ය උදාවෙන එකම ස්ථානය කමත වීමයි .එහි දෙවියන් වැඩ සිටින බවට විශ්වාසයක් ඇති අතර, එය ශුද්ධ භූමියක් ලෙසට ගැමියන් සලකයි. කමතේ හෝ ගුරු ගෙදර අගලක් කපා එයට ඉදිරියෙන් දණ්ඩි කඳ සිටවනු ලබයි .මේ සඳහා තෝරාගන් ලබන්නේද කිරි ගසක කදකි.එය ඇද නොවන්නක් වීමට වග බලා ගැනීම ගුරුතුමාගේ වගකීමකි..

මල් බුලත්, යහන් සකසා, ත්‍රිවිධ රත්නය නැමැද දෙවියන් වඩම්වා, පූජා පවත්වා සුභ නැකතට පොලොව මත සකසකරන ලද අගලක් වැනි තීරුවේ ගෝලයා බස්සවා,පිරිසිදු කරනලද දණ්ඩි කඳ මත අත් හිදුවා ගුරුතුමා විසින් පළමුවෙන්ම **තෙයි** කියමින් දණ්ඩි හරඹ අභ්‍යාස කිරීමට පටන් ගනී.

ගුරුවරයා විසින් ස්වකීය ශිෂ්‍යයාගේ හිස මත අත තබා ඔහුගේ දියුණුව ඉෂ්ට සිද්ධ වන බවටත් තමා ඉගැන්වූ ශිල්ප ශාස්ත්‍රය පිහිටන බවටත්,සත්ත වී ගුරුවරම් දිය යුතුය.මෙය හිස වෙස් මංගල්‍යයක් අතිශය වැදගත් හා අත්‍යාවශ්‍යම අංගයකි.

හිස වෙස් මංගල්‍යය සඳහා සාමාන්‍යයෙන් තෝරා ගනු ලබන්නේ පොහොය දිනයක උදය වරුවයි. නොඑසේ නම් වෙනත් සුභ දිනයකි.ඇතැමෙක් තෝරා ගනු ලබන්නේ චන්ද්‍රයා මෝදු වන දිනයකි. වර්ථමානයේ මෙහි තත්වය වෙනස් වී ඇත.කෙසේ වෙතත් සුබ දිනයක් සේ මංගල්‍යය සිදුකිරීම සිරිතකි.ඉහත දැක්වූ චාරිත්‍ර විහාරස්ථානයක දි ඉෂ්ඨ සිද්ධ කරන අතර,වෙස් මංගල්‍ය දිනයේ හවස සිට පසුදා පහන් වන තුරු කොහොඹාකංකාරි ශාන්ති කර්මයට නවක ශිල්පීහු සහභාගී වෙති.

හිසවෙස් මංගල්‍යයක් පවත්නා චාරිත්‍ර අතර අවසානය අභිචාරාත්මක ලක්ෂණ පෙන්වන චාරිත්‍ර බොහොමයකි.හිස වෙස් බැදපු ශිල්පියාට හිස වෙස් තැබීම නිසා කිසියම් ආකාරයක ඇස්වහ කටවහ,හදි හූනියම් ආදී දොස් ඇතිවී නම් ඒ සියල්ල දුරුකරනු පිණිස වස් දොස් හැරීමේ චාරිත්‍ර ඉටු කිරීමයි.

ඒ සදහා කොහොඹා කංකාරිය නටා අවසන් වූ දිනයේ රාත්‍රියේ හෝ හිස වෙස් තබා දින හතක් ඉක්මව යාමට මත්තෙන් හෝ වස් හැරීමේ සෙත් ශාන්ති කල යුතුවීම චිරාගත චාරිත්‍රයකි.මේ සදහා ගුරුවරයාගේ නිවසේදීම විස්කම් බලිය,ඇස්වහ මංගල්‍ය බලිය,සරස්වතී මංගල්‍ය බලිය,හත් අඩියේ දෙහි කැපීම,දිය කොරහේ බලිය වැනි සෙත් ශාන්ති කර්ම අතීතයේ පටන් සිදු කරන්නකි.

එකී වස් හැරීමේ චාරිත්‍ර ඉටුකිරීමේ අවසාන අංගය වන්නේ ගුරුවරයා විසින් හිස වෙස් තැබීමට පෙර ශිෂ්‍යයාට බදින ආරක්ෂා නූල කපා හැර නව ආරක්ෂා යන්ත්‍රයක් පැළඳවීමයි.එයින් හිස වෙස් මංගල්‍යය කටයුතු නිමාවේ.

ඉහත දැක්වූ චාරිත්‍ර වසර ගණනාවත් තිස්සේ පැවති අතර,මීට දශක පහක කාලයක පටන් නව්‍යමය වූ චාරිත්‍ර තිබෙන බව ඇදුරු මතයයි. එහෙත්

උත්සව චාරිත්‍ර ආරම්භයේ පටන් අවසානය දක්වා දින තුනක වැනි කාලයක ඇතුළත මෙම චාරිත්‍ර සිදු කරන බව පැහැදිළිය.

අතීතයේදී ශිෂ්‍යයා ගුරු ගෙදරම නැවතී සිටියද වර්ථමානයේ ගුරු ඇසුර සමග තම නිවසේ සිට ආධුනිකයා වෙස් මංගල්‍යයට අදාල සියළුමකටයුතු සිදුකරනු ලබයි. වර්ථමානයේ චාරිත්‍ර චාරිත්‍ර වගේම බාහිර ආටෝප ගති ලක්ෂණ සහ ජනප්‍රිය වීමේ අරමුණින් වෙස් මංගල්‍ය චාරිත්‍ර සිදු කරන බව පැහැදිළිය. මේ නිසාම හිසවෙස් මංගල්‍ය හා බැඳී පැවතුන ශිෂ්‍යයාගේ ශික්ෂණය,ගුරු ගෞරවය,ගුණ වගාව,ඇවතුම් ,පැවතුම්,ගුරු ගෙදරට ඇති ඇල්ම,ශිල්ප ඥාණය,විෂයෙහි ගැඹුර ,ශිල්ප ධර්ම, ශිලහි යන අවස්තාවද දක්නට ඇත.

වර්ථමානයෙහි සංස්කෘතිමය සංදර්ශණයට පමණක් සීමා වූ වෙස් මංගල්‍යය චාරිත්‍ර වීඩීන් වලට වඩා පැමිණ සිටින්නන්ගේ ප්‍රශංසාව බලා පොරොත්තුව කරනු ලබන්නක් බව පෙනේ.ඉතා කෙටි කවි ගායනා කීපයක් කියමින් සරල නර්තන චලන ටිකකට සීමා වීමද නර්තනයෙහි ගුණාත්මක බව පහළ යාමට හේතුවක් වී ඇත.

අතීතයෙහි හිස වෙස් බැඳි නර්තන ශිල්පීයා උඩරට නර්තන සම්ප්‍රදායෙහි කොහොඹා කංකාරිය මතු පරපුරට දායාද කිරීමක් වන අතර,සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම පිලිබද දැනුමත් .නර්තන ශිල්ප කුසලතාවත්,අයිලය,තොරණ,යහන්,මල්පැල.යක්ගේ,රගමඩුව,සැරසිලි,ගායනා,තිත්මාත්‍රා,අවදානම්,අභින,පෙරළුම් ආදියද පිලිබදව මනා දක්ෂතාවයක් පෙන්නුම් කරයි. ගෝලයා සෘජු අත්දැකීම් ගුරුවරයාගෙන් පමණක් ලබා ගනී. ඇතැම් විට ගුරුගොල වනු ලබන්නේ පිය පුතු හෝ ඥාති සම්බන්ධතා මතය . නමුත් වර්ථමානයේ පාසලේ හෝ කලායතනයේ හෝ නර්තනය උගන්වනු ලබන ආයතනයේ පරම්පරාවක් සාදාගැනීම මුඛ්‍ය පරමාර්ථය නොමැති බව පැහැදිළිය.

නූතනයේ හිස වෙස් බැඳි යෞවන කලාකරුවන් හිස වෙස් බැඳීමෙන් පසු එකී ශිල්ප ශාස්ත්‍රය ඉගෙනීම අවසන් කර නර්තනය ඉගෙනීමෙන් කෙළවරට පැමිණියේයැයි සිතීම සාධාරණ නොවන්නකි. තමා

හිනිපෙත්තතට නැගි නර්තන ශිල්පියෙක් යැයි බොළඳ මානසිකත්වයෙන් නව්‍ය ශිල්ප ඉගෙනීම අත හරිනු ඇත.

හිස වෙස් බැඳීම වූ කලී නර්තනය නම් ගැඹුරු ශාස්ත්‍රීය විෂයය ඉගෙන ගැනීමට පර්යේෂණ කිරීමට හා ව්‍යවහාර කිරීමට ලබා දුන් පූර්ව පිවිසුම් බලපත්‍රයක් යැයි නොසිතීම නර්තන කලාවේ පරිහානියට හේතුවනු ඇත.එය නර්තන කලාවේ සුරක්ෂිත බාවයක් නොවනු ඇත.

උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ ඒ ඒ ආභරණ පිලිබඳවත් ඒ ඒකොටස් වලට අධිපති දෙවිවරු පිලිබඳවත් ආධුනික ශිල්පීන් දැන ගැනීම ඉතා වැදගත් වනු ඇත.

පයලන සළඹේ ගිගිරි නාදයට අඟහරු දෙවියෝ බැලම ලතී
පළදින සළුවේ උල් උඩයට සකි සත්පත්තිනි දෙවි බැල්ම ලතී.
බඳිනා නරුවේ ඒ නව රැල්ලට නව ග්‍රහ දෙවියෝ බැල්ම ලතී
බඳිනා රැහැනේ වෙසෙනා දෙවියෝ පටික්කාර රති තාර පතී

ගත් විට දෙවියත සත් සඟලය වෙයි භද්‍රකාලි වරමින් බැන්දා
පොත්පට හරියට එතුවෙමි බඳවට මහා පද්ම අණයෙන් බන්දා
බඳවට බඳිනා ඉන පටියට සකි නාලොව දෙවි වරමින් බැන්දා
නුවනට අධිපති ගණදෙවි වරමින් හැඩවුනු ඉණ හැඩයක් බැන්දා

රජත බුබුළු ඇති අවුල් හැරය සකි වෙසෙනා දෙවියෝ නම් කවුරු
දියත පතල තෙද රණමයුරාසන වෙසෙනා උත්තම කඳ කුමරු
රුවින් දිලෙන තෙද කරවට මාලය අධිපති වන්නේ නම් කඳරු
අණත මහා කෙළ නාග රජාවෙයි නම්කර කීවේ පෙර ඇඳුරු

සිරිස් මුදුන බැඳ කිරුළු ජටාවට මහේෂ්වරා දෙවි බල දෙරණා
තෙදැස් පතුරුවන විෂ්ණු සුරින්දු පායින්පතට දිව නෙත හෙළනා
එරැස් දිලෙන තෙද වෛරෝඩි මැණිකට රාහු සුරුන්දා බල දරණා
තෙදැස් පතුරුවන සක්‍ර සුරින්දු ජටාරැලේ මල් කෙළි කෙළනා

දෙපා සහල සිට දෙව් කුලයට සකි ගණනින් ඇත්තේ ගැට විස්සයි
දෙකුලයෙ සිට බෙල්ල දෙවුරයට ගණනින් සූතිසක් ගැට ඇතිවෙයි
බෙල්ලෙන් උඩ සකි ගැට සිව් පණසකි එකතුව බැළුවම එකසිය අටවෙයි
මෙච්චා බැඳගෙන නැටුම් නටයි අපි ගීත කියයි දෙවියන් පිහිටයි

සකසා සුදින් අරගෙන සළු තුරුල්ලා
සකසා එ දිගුකර එල්වති දෙවල්ලා
සකසා අඹා අරගෙන හහල වල්ලා
අදිනා වත දැනගනු මේ සියල්ලා

අදිනාවත දැන ගන්න යක්දෙස්සනේ ගරු
අඟුලක් පමණ පෙති පන් සැටක් බිඳ හරු
සතුඟුල් නාඩු බව දැනගන්න සෙසු නරු
අදිනා වත දැනගන්න හැම මෙ සිව් නරු

## හිස වෙස් බැඳීමේ මංගල්‍යයේ චාරිත්‍ර විධි

## පූර්ව චාරිත්‍ර

**නැකත් බැලීමේ චාරිත්‍රය** - මේ සඳහා පුර පක්ෂයේ සුභ දිනයක් යොදාගනු ලැබේ.එක් ආධුනිකයෙකු නම් ඔහුගේ වේලපත් කඩේ අනුවද, කිහිප දෙනෙකු නම් සහභාගී වන සියළුම දෙනාගේ ජන්ම පත්‍රය ද, නක්ෂත්‍ර ශිල්පියා විසින්, පරීක්ෂා කර බලා සුභ මුහුර්තියක් සාදනු ලැබේ.

**සුදුසු ස්ථානයක් තෝරා ගැනීම -** මේ සදහා තුන් බෝධිය ඇති ස්ථානයක් තෝරා ගනී.ඊට හේතුව තුන් බෝධියට අදාල චාරිත්‍ර නිසි පරිදි ඉටුකිරීමට පහසුවක් ලැබීමය.මේ සදහා විහාරස්ථානයක් තෝරා ගනී. වර්ථමානයේ මේ පිලිබදව සැළකිළිමත් නොවන බව පෙනේ. මේ සදහා පුරාතණයේ සිට සුසාන භූමි,පාළු භූමි වැනි ස්ථාන තෝරා නොගැනීම සිරිතකි.

**ආරාධනා කිරීම -** සුභ නැකතට අනුව, ගුරුවරුණ්ට ඥාති හිත මිත්‍රාදීන්ට බුලත් දී ආරාධනා කිරීම පුරාතණයේ සිට පැවත එන සරිතකි.මහා සංසරත්නයට දැහැත් පිළිගන්වා ආරාධනා කළ යුතුය.ගුරුතුමා තමා විසින්ම වෙස් මංගළ්‍ය චාරිත්‍ර ඉෂ්ඨ නොකරන්නේ නම් ඒ සදහා සුදුසුකම් සහිත අත්දැකීම් පිරිපුන් චාරිත්‍ර ශිල්පියෙකුට බුලත් දී ආරාධනා කර දින පොරොන්දු ලබා ගත යුතුය.

**දෙමාපියන් භාරකරුවන් දැනුවත් කිරීම -** සාම්ප්‍රදායික හිස වෙස් පැළදවීමේ මංගළ්‍යයක් සිදුකරන ආකාරය පිළිබඳ දෙමාපියන්ට හා වැඩිහිටියන්ට පුළුල් දැනුමක් ලබා දිය යුතුය.මෙම කටයුත්තේ ඇති සංස්කෘතික වටිනාකම් ඒ හා බැදුණු හර පද්ධතීන් ,වෙස් බැදී ශිල්පියාගේ මානවීය ගුණාංග මතු ජිවිත පැවැත්මට උපකාරීවන ආකාරය ආදිය පිළිබද දීර්ඝ පැහැදිළි කිරිමක් කිරීම ඉතා වැදගත්ය.වර්ථමානයේ මේ පිළිබදව දෙමව්පියන් හා වැඩිහිටියන් දැනුවත් නොකිරීමේ හේතු කොටගෙන නර්තනයේ ගුණාත්මක බව හීන වී ඇත.

**ජේ වීමේ චාරිත්‍රය -** හිස වෙස් බදින ආධුනිකයා අදාල සුභ දිනයට පෙර අවම වශයෙන් මාස තුනක් මුළුල්ලේ පටන් කිළි කුණුවලින් වැලකී ජේ වී සිටීම පුරාතණ චාරිත්‍ර වාරිත්‍රයකි,ගැහැණු දරුවන්ගේ වැඩිවියටපත් ස්ථානවල නොරැදීම,මළ ගෙවල් වලට සහභාගී නොවී සිටීම,මස් මාංශ අනුභව නොකීරීම ද,රෙදිවැල් යටින් රිංගා යාම ආදිය ද පුරාතණයේ සිට පැවැතෙන්නකි.අතිතයේ ගුරු ඇදුරන් මේ චාරිත්‍ර නිසියාකාරව කළ බව පැරණි ඇදුරන්ගේ අදහස වේ.

පෙරදින චාරිත්‍ර වාරිත්‍ර

වෙස් බඳින ආධුනික ශිල්පියා තමා කළයුතු නොකළ යුතු දේ පිලිබඳව මනා වැටහීමක් තිබිය යුතුය.දින කිහිපයක් පටන් විහාරස්ථානයක ලැගුම් ගන්නා ආධුනිකයන් විහාරස්ථානය හා සම්බන්ධ සියළුම පුණ්‍ය කටයුතු සදහා සහභාගී විය යුතුය.ආධුනිකයා තම ගුරු ඇදුරන්  හෝ වෙස් චාරිත්‍ර ශිල්පියා දෙනු ලබන පූර්ව උපදෙස් අනුව කටයුතු කිරීමට වග බලා ගැනීම ඉතා වැදගත්ය,

- විහාරය,විහාර භූමිය අවට,අතුගා පිරිසිදු කිරීම,
- ගෞරවණීය  සංඝරත්නයේ අනුශාසනා මත අංග සම්පූර්ණ බෝධි පූජා පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම
- උපස්ථාන කටයුතු(ගුරු,දෙමව් පිය, සංඝ රත්නය ආදියට)
- මානසික සුවය සහ කායික සුවය ඇතිවන පරිදි  කටයුතු කිරීම.
- පසුදා දිනයට අවශ්‍ය සියළුම දේ සූදානම් කර ගැනීම.

**වෙස් මංගල්‍යය සඳහා අවශ්‍ය රංග භූමිය සකස් කිරීම.**

අතීතයේ දී  මඩුවක්  ඒ සදහාම තනා ඇත. ස්ථිර ගොඩනැගිල්ලක් හෝ තාවකාලික ගොඩනැගිල්ලක් යොදා ගැනීම වර්ථමානයේ දක්නට ඇත.ඇතැම් විට කොහොඹා කංකාරියට සමාන මඩුවක් සකස් කරයි. මඩුව තනනු ලබන ස්ථානයේ දී.ඇතැම් විට මාස තුනකට පෙර මඩුව සඳහා කප් සිටවනු ලබයි.වර්ථමානයේ පවතින ස්ථානීය, සමාජීය, ආර්ථික ගැටළු හමුවේ එසේ සිදු කිරීමට  ප්‍රායෝගික හැකියාවක් නැත. කෙසේ වෙතත් තනනු ලබන මඩුවෙහි පොදු ආකෘතිය හා සැලැස්ම සමානකමක් දක්වන අතර සැරසිලි සහ ඒ සදහා යොදාගනු අමු ද්‍රව්‍ය සමාන වේ. මල් පැල් ,අයිලය,යහන්,සුභ දිසාවන්ට අනුව ඉදිකරනු ලබයි.ඒවා උඩරට සාම්ප්‍රදායික සැරසිලි කලාව හා නව්‍යමය කලාංග වල එකතුවකි.රංග භූමියෙහි පස්වලු එල්ලා අලංකාර කර ගන්නා අතර ඒවා අලංකරණය කිරීමේදී එහි වර්ණ හැඩය තබන ස්ථානයන් අනුව අපූර්වත්වයක් ලැබේ.හිටුවා ඇති කිරි ගස වටා ගොක් රැහැන් අදිනු ලබයි.මඩුවේ එක්

කොටසක් ප්‍රේක්ෂකයන් සඳහා වෙන් කර තබයි.සංඝරත්නය සඳහා වෙනම ඉදිරිපස ස්ථානයක අසුන් හිඳුවා තබයි.

## තොට පේ කිරීම

ආධුනිකයාට පැන් ස්නානය කිරීම සඳහා ගලායනු ලබන දිය පහරක ස්ථානයක් තෝරා ගනී. පෙර දිනයෙහි එම ස්ථානය පේ කළ යුතුය.ගොක් රුහැන් ඇද වෙන් කිරීම සහ ආරක්ෂා කර ගැනීම අතීතයේ සිට සිදු කරන්නකි .වර්ථමානයේ මේ තත්වය විවිධ හේතූන් මත වෙනස් වී ඇත.

## කිරි ගස පේ කිරීම සහ වෙන් කිරීම

විශේෂයෙන් පලදාව ලැබූ කොස් ගසක් මේ සඳහා විහාර භූමියේම තෝරා ගනී. චාරිත්‍ර දිනයෙහි වෙස් බැඳි ශිල්පියා කිරි බැලීම  හෝ කලස බිඳීම සඳහා  මෙම ස්ථානය යොදා ගනී.

## හඟල යැදීම හා රංග වස්ත්‍ර පේ කිරීම

ආධුනිකයා පළදින හඟල පේ කරන අතර එහිදී හගල යැදීමක් කරනු ලබයි. ගුරුවරයා හෝ චාරිත්‍ර ශිල්පියා යහන් ඉදිරියේ හඟල යැදීම සිදුකරයි.ඒ සඳහා ප්‍රවීණ ශිල්පීන්ද සහභාගීවීම සිරිතකි.

## දෙමව්පියන් ගුරුවරුන්ගෙන් අවසර ගෙන ලැගුම් ගෙට යාම

පසුදා උදෑසනම අවදිවන බලාපොරොත්තුවෙන් ආධුනිකයා ලැගුම් ගනී.ඇතැම් අවස්ථාවලදී බුද්ධ මන්දිරයේ හෝ ධර්ම ශාලව මේ සඳහා තෝරා ගනී.  වෙනත් බාහිර සමාජයෙන් දුරස්ව  නින්දට යාම සිරිතකි.

## ස්නානය කිරීම.

සූරිය උදාවමට පෙර තම ගුරුවරයා හෝ චාරිත්‍ර චාරිත්‍ර ශිල්පියා සමග වෙන් කර සූදානම් කරන ලද ස්ථානයට පිටත් වේ. කතා බහෙන් තොර මනා සංයමයකින් ගුරුවරයා පසු පස ගමන් කරන ආධුනිකායා තම චාරිත්‍ර චාරිත්‍ර ශිල්පියා හෝ ගුරුවරයා විසින් ඉටු කරන චාරිත්‍රවලට සහභාගී වීම වැදගත්ය.මෙහිදී හිසෙහි හා ශරීරයෙහි දෙහි, බෙහෙත් ගල්වා බෙහෙත් පැන් කලය නමස්කාර පූර්වකව නහවයි.සුදු පිරුවටයක් හැද පැළඳ සිටින ආධුනිකයා වැද නමස්කාර කර සිටී.අනතුරුව පැන් කළ හතක් හතක් ,දහ හතරක් විසි එකක් ආදී වශයෙන් නහවයි,විවිධ ප්‍රදේශවල වෙනස් කම් දක්වයි,මෙහි ප්‍රධාන අරමුණ වන්නේ පිරිසිදු වීමයි.නහවා අන්තිම පැන් කලය සුදු රෙදිකඩකින් වසා රැගෙන ඒම සිරිතකි.මෙම චාරිත්‍රය පෙර දිනයේද සිදු කරන බව දක්නට ලැබේ .එහි වරදක් කිව නොහැකි වන්නේ අරමුණ එකක් වීම නිසාය.

විශේෂයෙන් කිරිගසක කොස්ගසක කොළයක නැටිට පෙනීමට පෙර නහවා ලැගුම් ගෙට ගැනීමේ චාරිත්‍රය සිදුකල යුත බව ඇතැමෙකුගේ මතයයි.

## වෙස් බඳින දින චාරිත්‍ර .

- සංඝරත්නයට ආරාධනා කිරීම සහ අසුන් පනවා තිබීම.
- මල් පහන් පුජා පැවැත්වීම.
- බුද්ධ මන්දිරය අදාල කටයුතු සඳහා සූදානම් කිරීම.
- ගුරුවරයාට වැද උල්උඩය රැගෙන හිස වෙස් හැර ඉතිරි කොටස් හැඳ පැළඳ ගැනීම. අතීතයේ මෙය ඇඳ පැළඳ ගත යුත්තේ ආධුනිනයා විසින්මය.එයට හේතුව වනනේ ආධුනිකයා තනි කච්චි ඇඳුම ඇද ඇති පුරුද්ද හැකියාව මේ වන විටත් ඔහු ලබා ඇති නිසාය.එහෙත් වර්ථමානයේ එකී පුරුදු පුහුණුව නොලත් ආධුනිකයාට වෙනත් හිස වෙස් බැදි ශිල්පියෙකු විසින් මෙම කාර්ය ඉටු කරනු ලබයි.

- සුභ නැකත උදාවීමට පෙර සංසරත්නය විසින් හිස වෙස් බදින ආධුනිකා සහ සියළුම දෙනා පංච ශීලයේ පිහිටුවීම .
- පිරිත්,ජයසක් මංගල  බෙර මධ්‍යයේ  වෙස් නර්තන ශිල්පියෙකු හෝ ගුරුවරයා විසින් සුභ නැකතට හිස වෙස් පැළඳවීම.
- සුදු පාට වහන්තරාවෙන් (සුදු රෙද්දක්) හිසවෙස් බැදි ශිල්පියා අවට නොපෙනෙන පරිදි වසා විහාර ගෙයින් දොරට වැඩමවීම. පිරිස බොහෝ දෙනෙක් සිටිනම් වයස අනුව, පළමුව වැඩිමහල් අය පිළිවෙළින් දොරට වැඩම වීම කිරීම සිරිතකි.වට පිටාව නොපෙනෙන පරිදි  පැන් කලය හෝ පෝල් මල් අතැතිව ශිල්පියා දොරට වඩී. පංචතූර්ය වාදනය හෝ බෙර වාදනය මධ්‍යයේ පළමුව තුන් බෝධිය තුන් වරක් පැදකුණු කරයි.
- කිරි ගසකට කඩුවකින් කොටා කිරි පහර බැලීම.(වස්දෝස් දුරු කර සෞභාග්‍ය උදාවීමේ සංඛේතයක් ලෙස)
- කිරි එළ දෙනෙකු බැලීම.(සෞභාග්‍ය )
- රිදී කාසියක් සහිත කහදියර කොරහක් හෝ ජල කොරහකින් පළමු වරට මුහුණ බැලීම. (මේ සඳහා පන්දමක් ද ඇතැම් ශිල්පීන් භාවිතා කරයි.)
- නැවත කණ්නාඩියෙන් මුහුණ බැලීම.
- කෙසෙල් අත්තක් හිසට උඩින් තබා පැන් වැක්කිරීම.
- ආධුනික ශිල්පියා අතැති පැන් කළය හිස වටා තුන් වරක් කරකවා බිම පතිත කරවීම.
- වහන්තරා රෙද්ද ඉවත් කර චෛත්‍ය දෙස බලා වැදීම.
- රෙද්ද මත බුලත් අතක් සමග ගුරු පඩුරක් තබා ගුරුවරයාට චාරිත්‍ර ශිල්පියාට වන්දමාන කිරීම.
- දෙවියන් වෙනුවෙන් පුජා වට්ටියක්, පඩුරු වෙන් කිරීම පූජා කිරීම.
- ත්‍රිවිධ නමස්කාර,දේව නමස්කාර ගායනය කිරීම, වෙස්  පැලදි ශිල්පියා පළමු නර්තනය මංගල නර්තනය සභාව ඉදිරියේ ඉදිරිපත් කිරීම.
- ගුරු වන්දනාව ( ගායන හා නර්තනය සමග)
- මව්පිය වන්දනාව( ගායනය හා නර්තනය සමග)

- ශිල්පීය දක්ෂතාව පෙන්වීම සඳහා උඩරට නර්තනාංග ඉදිරිපත් කිරීම.
- ගුරු පඬුරු පිදීම
- දෙහි කැපීම,උඩරට සම්ප්‍රදායට අයත් බලි ඇරීම ආදිය සිදු කිරීම.
- ආරක්ෂා නූලක් හෝ යන්ත්‍රයක් පැළඳවීම.
- ආධුනික ශිල්පියා අන්‍යයන්ට ආචාර සමාචාර කිරීම.තෑගි බෝග ලබා ගැනීම ආදිය.

## පසු චාරිත්‍ර වාරිත්‍ර හා අත්දැකීම් ලැබීම.

- මාස තුනක් කිළිවලින් ආරක්ෂා වීම.
- පුණ්‍ය කටයුතු වලට සහභාගී වීම.
- තමා විසින් ඇඳුම් තනිවම ඇද පැළඳ ගැනීම
- ගුරුවරයා දේවත්වයෙහිලා සැලකීම..
- සෑම අවස්ථාවකදීම වෙස් ඇඳුම් කට්ටලය සඳහා සුදුසු ස්ථානයක් තෝරාගැනීම.
- ආදර්ශවත්වීම තුළින් තමා ජීවත් වීමට අත්දැකීම් ලබා ගැනීම.
- අදාල ඇඳුම් පැළඳුම් පිරිසිදුව ගෞරවාන්විතව තබා ගැනීම.

එහෙත් වර්තමාන පාසල තුළ බොහොමයක් පාසල් ගුරුභවතුන් මෙම විෂයය රැකියාමය කාරියකට පමණක් ආරෝපණය කරමින් කටයුතු කිරීම කණගාටුදායක තත්ත්වයකි. පාසල් කාලය කුමන හෝ ක්‍රියාදාමයක් අනුගමනය කොට තම පෞද්ගලික ජීවිතයට මුල් තැනක් දීම වෘත්තීමය ස්වභාවයක් නොවන බව පසක් කල යුතු ය. මේ පිළිබඳව අවධාරණය කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් 2011.03.29 නිකුත් කරන ලද 2011/ 15 චක්‍රලේඛය අවදානයට ගත යුතු ප්‍රබල සාධකයකි. එහි සඳහන් කරුණු අතර,

1. විෂය නිර්දේශය පාසලේ දීම සම්පූර්ණ කල යුතු ය. එසේ නොකර පාසල් විෂය නිර්දේශය ආවරණය කිරීමට තම පෞද්ගලික පන්තියට සිසුන්ට ආරාධනා කිරීම සපුරා තහනම්ය.

2. පාසල තුළ මුදල් අය කරමින් පෞද්ගලික පන්ති පැවැත්වීම සපුරා තහනම්ය.
3. යම් වූ සංදර්ශනයක් හෝ විශේෂ අවස්ථාවක් සඳහා බාහිර සම්පත් පුද්ගලයින් යොදා ගැනීම පාසල් කාල සීමාව තුළ සිදු නොකල යුතු අතර, ඉගෙනුම් ක්‍රියාවලියට ද හානියක් නොවිය යුතු ය.
4. වයස අවුරුදු 15 ට අඩු පිරිමි දරුවන්ට හිසවෙස් බැඳීම නොකළ යුතුය.
5. උත්සව පෙරදින සහ උත්සව කටයුතු අවසන් වීමෙන් පසුසහභාගීවන සියළුම දෙනා සාරධර්මවලට පටහැනි වන සේ කටයුතු සිදුකිරීමෙන් සම්පූර්ණයෙන් වැලකී සිටිය යුතුය.
6. හිස වෙස් බැඳීම පාසලේ නර්තනගුරුභවතාගේ මූලිකත්වයෙන් සිදු කිරීම අනිවාර්ය වේ.

එම චක්‍ර ලේඛයෙහි අරමුණු ලෙස සඳහන් කර ඇති දේ වෙස් මංගල්‍ය පවත්වන ගුරුභවතුන්ගේ විශේෂ අවධානයට යොමුකල යුතු කාරණා බව පැහැදිළිය.

- සුසමාහිත පෞරුෂ සංවර්ධනය සඳහා විඥානශක්තන් වර්ධනය, රසඥතා වර්ධනය,ආකල්ප වර්ධනය සහ ශක්‍යතා වර්ධනය
- නර්තන විෂයය හා බැඳි අචාර ධර්ම ආරක්ෂා කිරීම.
- උඩරට සාම්ප්‍රදායික නර්තනය සංරක්ෂණය කිරීම.
- නර්තන විෂයයෙහි ගුණාත්මක සංවර්ධනය.
- හිස වෙස් බැඳීම සිසුන්ගේ කැමැත්ත අනුව පමණක් සිදු කිරීම.
- දෙමව්පියන් සහ සිසුන් අසීරුවට පත් නොකිරීම.
- දෙම්ව්පියන් සහ සිසු දරුවන් මුල්‍යමය අපහසුතාවලට ලක්වීම වැලැක්වීම.

එම චක්‍ර ලේඛයෙහි සදහන් ආකාරයට අධ්‍යාපනය සබැඳි විෂය භාර අධ්‍යක්ෂකවරයාගේ වගවීම හා වගකීම ඉතා වැදගත් බව පෙන්වා දී ඇත. පාසල් විෂයමාලාව තුළ පමණක් රැඳී නොසිට පාසල් කාලය අර්ථාන්විතව

හැසිරවීමත්, පාසල් කාලයෙන් පසු තම සිසු සිසුවියන් සමඟ විෂය ප්‍රවර්ධනාත්මක කටයුතු කෙරේ නැඹුරුවීමත් ගුරුභවතෙකු සතු වගකීමක් වනු ඇතැයි එයින් ගම්‍යමාන වේ. එකී චක්‍ර ලේඛයෙහි හිස වෙස් බඳින ආධුනිකයා සම්පූර්ණ කල යුතු අවම විෂයය සන්ධාරය පෙන්වා දී ඇත්තේ එහි ගුණාත්මක බව ආරක්ෂා කිරීමට බව පැහැදිලිය.ඒ අනුව එහි සඳහන් විෂයය සන්ධාරය පහතින් දැක්වේ

**හිස වෙස් තැබීම හා ශීර්ෂාභරණ පැළඳවීමේ දී සිසු සිසුවියන්ට ප්‍රගුණ කල යුතු අවම විෂය සන්ධාරය**

- මංගලම්,
- හත් පදය,
- යක් ඇන්නුම,
- මඩු පුරය සහ මල් හත් පදය,
- අස්නෙ, ආවැන්දුම,
- කෝල්මුර දෙකක්,
- දාන එකක්,
- කතා එකක්,
- යක්කම් එකක්,
- හඟල යැදීම,
- මල් යහන්,
- මාරා පදය සමග අදාළ ගායනා සහ වාදනය පිළිබඳ කුසලතාවය තිබිය යුතු ය.

**වෙස් චාරිත්‍ර ශිල්පියෙකු විසින් නොලයුතු දේ.**

වර්ථමානයේ වෙස් මංගල්‍ය හතු පිපෙන්නාක් මෙන් දක්නට ලැබේ .වෙස් මංගල්‍ය හා ශීර්ෂාභරණ පැළඳවීමේ උත්සව බොහෝ ගුරු භවතුන් විසින් පවත්වති. එහි ගුණාත්මක බව වැඩි දුරටත් සංවර්ධනය වීම තුළින් අප රටෙහි අනන්‍යතාවය තව දුරටත් රඳවා ගැනීමට අවස්ථාවක් හිමිවනු ඇත .ආර්ථිකමය පරමාර්ථ ඔස්සේ නර්තන කලාව වේගයෙන් පරිහානියට ලක්වන අවස්ථාද දක්නට ඇත.එබැවින් වෙස් මංගල්‍ය වෙස් බඳින ආධුනික

ශිල්පීන් සමග මුහු නොවන්නේ නම් එය වඩාත් යෝග්‍ය වනු ඇත. දීර්ඝ කාලයක් තිස්සේ පැවත ආ අපේම සංස්කෘතිකමය දායාදයන් අප විසින් විනාශ කරනු ඇත. එබැවින් වෙස් මංගල්‍ය ස්වාධීන සංසකෘතිකමය උත්සවයක් ආකාරයෙන් කල මනාය .

වර්ථමානයේ ඉතා කෙටි කලෙකින් පුහුණුව ලබන ආධුනිකයා තම කලා ජීවිතයේ අතරේ අතරමංවන අවස්ථාද ඇත .එබැවින් වෙස් මංගල්‍යයක් තුළ පහත සදහන් දේ දැකීමට අවස්ථාවක් නොදීම ජාතික කලාවක් සුරකින අප හැම දෙනාම සිතිය යුත උතුම් සිතුවිල්ලක් වනු ඇත.

**ආධුනිකයෙකුට නර්තනය පුහුණු කිරීමේ දී සැළකිලිමත්විය යුතු කරුණු.**

- ඉවසීමට ආධුනිකයන් පුරුදු පුහුණු කිරීම.- මේ සදහා නර්තනය ඉගෙන්වීමට පෙර මානසික සිථිලකරනය හෙවත් මනස සැහැල්ලු කිරීමේ අභ්‍යාස කරවීම.පරසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් කිරීම. භාවනා වැඩ සටහන් යනාදිය සිදුකර ගෝලයන් යහපත් සිතුවිලි වලින් දීප්තිමත් කරවීම.
- සියුම් මිහිරි නාද සහිත සංගීත ඛන්ඩයන් අසන්නට අවස්ථාව ලබා දීම.
- කායික සිථිලකරණය සදහා සැහැල්ලු අභ්‍යාස (ඒ සදහා ක්‍රමික අපහසුවෙන් තොර විනෝදයෙන් කල හැකි අභ්‍යාස දීම වැදගත්ය .අපහසුවෙන් ආධුනිකයාට නර්තන කලාව කා වැද්දීම තුළින් එපා වීම් සහ නර්තන විෂයයට ඇති කැමැත්ත හීන වනු ඇත.
- නර්තන විෂයයට අදාල සරඹ අභ්‍යාස පුහුණුව - මේ සදහා පංති කාමරයේ මෙන් විනාඩි ගණනකට සීමා වුණු අභ්‍යාස කීපයක්ම දීම සුදුසු නොවනු ඇත.එකම අභ්‍යාසය වුවද නිශ්චිත සාම්ප්‍රදායික හැඩතල අංග චලන ප්‍රදර්ශණය වන ආකාරයට පුහුණු වීම් කිරීම වැදගත්ය .මෙකී පුහුණු වීම් කරන විට ගුරුභවතාගේ කටෝර වදන් කැගැසීමේ වෙනුවට සංයමයෙන් වචන හා භාෂාව හැසිරවීමට ගුරුවරයා වග බලා ගත යුතුය.චලන අභ්‍යාසයේ දී හැමවිටම සංගීත ඛණ්ඩයක් හෝ මිහිරි බෙර වාදනයක් සහාය සදහා යොදාගැනීම තුළින් ආධුනිකයාට කැමැත්තක් ඇති වනු

ඇත.බෙරයේ අක්ෂර වෙනුවට කටෝර හඩ ශ්‍රවණය වන්නේ නම් එහි ඝෝෂාවට ආධුනිකයා කැමැති නැති බව මනෝ විද්‍යාත්මකව තේරුම් ගැනීම ගුරුවරයාගේ වගකීමක් වන්නේය.

- ශාරීරික නම්‍ය තාවය නොමැතිව අත පය හැසිරවීම තුළින් ආධුනිකයාගේ ශරීර අපහසුතා ඇතිවීම වැලැක්විය නොහැක. ඇතැම් අවස්තාවලදී පුහුණුවීම සිදු කරනුයේ පංතිකාමරයට ඇතුල්වීමේ සිට "තෙයි.. වශයෙන් මණ්ඩියට නම්මවා පහත් කරවා ශබ්ද නගා කකුල් පෝලොවේ වදද්වා ලීමය .මෙය ආධුනිකයාට අපහසුය.වර්ථමානයේ නර්තන විෂයය ආරම්භක වසරවල පිරිමි දරුවන් අංග චලන අපහසුතා කලිසම් ඇද නර්තනය කිරිමේ අපහසුතා නිසා විෂයය අතහැර දමනු ඇත.

නර්තන කලාව හා සම්බන්ධවන තම ගෝල පරම්පරාව නිර්මාණය කිරීමේ දී ඔවුන්ට පහත සදහන් මානවීය ගුණාංග පුරුදු පුහුණු කර විම ගුරු ශිල්පීන්ගේ වගකිම වේ.

- තම ගුරුවරයාගේ ශිල්පය පමණක් නිවැරදිය ...අන් අයගේ දේ වැරදිය පහත්ය යන ආකල්ප නොඑන පරිදි අදහස් තම සිසුන්ට ලබා නොදීම.
- ඉවසීම සහ අන් මත ගරුකිරීම.
- නර්තන කලාව ගෞරවණීය කලාවක් බවත්, එය හැල්ලුවට ලක් නොකිරීමට වග බලා ගැනීමට අවශ්‍ය උපදෙස් හා අත්දැකීම් ලබා දීම.
- ගුරුවරයාට මන්ම ශිල්පයට ගරුකිරීම.
- සිසුන් ඉදිරියේ ආදර්ශවත් බව සුරැකීම.
- අන් අයගේ දුර්ගුණ නොව යහපත් දේ පමණක් සිසුන් ඉදිරියේ තකා කිරීම.
- නර්තනය හා බැදි සිරිත් විරිත්, ඇදුම් පැළදුම්, වාදන, රග බිම්, පසුබිම් ,සැරසිලි යනාදි හැම දෙයකටම ස්වයං ගෞරවයක්,භක්තියක් දැක්වීමට හැකි පුද්ගලයෙක් නිර්මාණය කිරිම.

## වෙස් තැබීමේ මංගල්‍ය උත්සවවල දී නර්තන ගුරුභවතුන්ට අමතකවන දේ.

ඇතැම් අවස්තාවලදී පාසල් සහ වෙනත් ආයතන වෙස් මංගල්‍ය උත්සව පැවැත්වීමේ අරමුණු විවිධාකාර වේ.ආධුනිකයා ශිල්පීයත්වයට පත්කරනවා වෙනුවට ගුරුභවතුන් තමාගේ ජනප්‍රියතාවයට හෝ යමක් කරන්නාට කරන්නා න්‍යායෙන් පවත්වති.එහිදී හදුනාගත් ගැටළු කීපයක් නර්තන විෂයයෙහි ගුණාත්මක සංවර්ධනය සදහා පහතින් දැක්වේ.

- නිසි පරිදි ශිල්පීය දක්ෂතාවයන් පෙනෙන පරිදි ආධුනිකයන් ගේ කුසලතා සංවර්ධණය කිරීම.
- උත්සව සංවිධානයෙහි දුර්වලතා.
- වෙස් බැඳීම සිදුකරන දිනය දක්වා තම ගෝලයන්ගේ සෞඛ්‍ය සහ පෝෂණයට අදාල කරුණු පිළිබඳ අවබෝධය.
- ආරාධිතයන්ගේ පිලිගැනීම් සහ සංග්‍රහ කටයුතු.
- උත්සව දිනයට අදාල ද්‍රව්‍ය හා ස්ථාන පිළිබද පෙර සූදානම.
- සිසුන්නම් පෙර දිනයේ කායාක සහ මානසික නිදහස සමග පෝෂණය.
- සියළුම සථානවල පේ කිරීම් සහ සූදානම්.
- පාසල් සිසුන්නම් අධ්‍යාන අමාථ්‍යාංශයෙන් නිකුත් කරන ලද චක්‍ර ලේඛ පිලිබද අවබෝධය.
- මුල්‍යමය සහ විමර්ශණ කටයුතු වල ගැටළු නොවන සේ කටයුත කිරීම සහ පූර්ව උපදෙස් හා අවසර ලබා ගැනීම.
- ප්‍රයෝජනයට ගත් ස්ථාන පෙර පරිදි පිරිසිදු කිරීම්.
- චාරිත්‍ර ශිල්පීන් ඇතුළු කණ්ඩායමේ ආහාරපාන ඉදුම් හිටුම් පිළිබඳව විශේෂ අවධානය.
- ආධුනිකයන්ගේ ආරක්ෂාව පිළිබඳ වගකීම.
- ඇතැම් දෙමව්පියන්ට ඇතිවන මුල්‍යමය සහ සහභාගීත්ව අපහසුතා පිළිබඳ අවබෝධය.

කෙසේ වෙතත් වෙනත් කිසිදු පාර්ශවයක් අපහසුවන ආකාරයේ වෙස් මංගල්‍ය පැවැත්වීම නොකිරීමට සියළුම දෙනා වග බලා ගත යුතු අතර,එය නර්තන විෂයෙහි ගුණාත්මක බව ආරක්ෂා වීමට හේතුවක්ද වන්නේය.

1. කුමන හෝ සංදර්ශනයක් සඳහා ඇඳුම් නිර්මාණයේ දී සිසු සිසුවියන්ගේ ආත්ම ගෞරවය සුරකෙන පරිදි සිදු කල යුතු ය. අනවශ්‍ය ආකාරයෙන් අග පසග නිරාවරණය කිරීම, අසංවරශීලී ඇඳුම් නිර්මාණය කරවීම පාසලේත්, ගුරුභවතාගේත්, ප්‍රජාවගේත් ආත්ම අභිමානයට හානියක් වනු ඇත.
2. අදාල විෂය භාර ගුරුභවතා සමස්ත විෂය කරුණු කෙරෙහි දැනුවත් විය යුතු ය. මෙහි දී උඩරට, පහතරට, සබරගමු සමස්ත සම්ප්‍රදායන් පිළිබඳව අවබෝධාත්මක විය යුතු ය.
3. සෑම අවස්ථාවකම ගුරුභවතා ආදර්ශමත් පුද්ගලයෙකු විය යුතු අතර, දරුවාට මග පෙන්වන්නෙක් ද විය යුතු ය.
4. විෂය භාර ගුරුභවතා පන්ති කාමරයට ප්‍රවිශ්ට වීමේ දී සමස්තයෙන් සූදානම් වූ අයෙකු විය යුතු ය.

මෙයින් පැහැදිළ වනුයේ වෙස් මංගල්‍ය කටයුත්තක් සිදු කිරීම වන්නාට වන්නාවූත් , කරන්නාට කරන්නාවූත් දෙයක් නොව ලාංකීය සංස්කෘතිය හා සාරධර්ම සිසුන්ට දායද කරන උතුම් කාරියක් වන බවය. එහි ගුණාත්මක සංවර්ධනය උදෙසා නර්තන ගුරුතුමන්ලා බොහෝ දේ අවධානයට ගත යුතු කාලෝචිත ගැටළුවක් බව සඳහන් කිරීම අතිශෝක්ති නොවනු ඇත.

# තම්මැට්ටම් කඩිප්පු නිර්මාණය

නර්තනය ඉගෙන ගන්නා ආධුනිකයා වාදනය පිළිබඳව හැකියාවද පුරුදු පුහුණු වීම ඉතා වැදගත්ය.ඒ අතර තම්මැට්ටම් වාදනය විශේෂ වේ. පෙරදිග තූර්ය වාදක කණ්ඩායම,හේවිසි කණ්ඩායම,විවිධ නර්තන තරග.පාසැලේ සහ වෙනත් උත්සව සඳහා නර්තන දායකත්වය සඳහා ප්‍රධාන සහ සහාය වාදන භාණ්ඩයක් ලෙස තම්මැට්ටම වාදනය අවශ්‍ය වනු ඇත.තම්මැට්ටම වාදනය කරන ස්වභාවය අනුව ද එහි කඩිප්පුවේ පැවැත්ම තීරණය වේ.

පංති කාමර ඉගෙනුම් ක්‍රියාවලියේදී ද, වෙනත් විෂයය බාහිර ක්‍රියාකාරකම්වලදීද තම්මැට්ටම් කඩිප්පුවක් විනාශ වුවහොත් හෝ අබලන්වීම හෝ කැඩීම නිසා වාදනය අත් හරින අවස්ථාද ඇත. ඒ සඳහා කඩිප්පුවක් සොයා ගැනීමට ගුරු සිසු දෙපාර්ශවයම මහත් පරිශ්‍රමයක් දරති. ඇතැම්විට නර්තනය උගන්වන ආයතනයන්හි පාසල් පංති කාමර වල මෙවන් අබලන් වූ භාණ්ඩ ඉවත් කර ඇත. එයින් සිදුවන්නේ තම්මැට්ටම භාවිතාව නොවීම හේතුවවෙන් තව තවත් වාද්‍ය එම භාණ්ඩය දිරා පත් වී යාම හෝ සතුන්ගෙන් හානි වී ලී කොටයක් පමණක් බවට පත්වීමය . එබැවින් වර්ථමානයේ දවුල් කඩිප්පුවක් සකසා ගැනීමට හුරු වීම කාලීන අවශ්‍ය තාවයකි.



පාසල් සිසුවෙක් කඩිප්පුවක් සැකසීම.



පාසල් සිසුවෙක් කඩිප්පුවක් සැකසීම



## තම්මැට්ටම් කඩිප්පු සෑදීම සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය

- ඇද නොමැති කිරිඳි වැලක්/ හීන් වේ වැලක්/රත් මල් කෝටු
- නූල්
- පිහියක්
- කතුරක්
- රවුම් ලී කැබැල්ලක් (කඩිප්පුව රවුවට ගැලපෙන පරිදි)
- රතු,සුදු,රෙදි
- ගම් ද්‍රව්‍යක්
- පහනක් /ඉටි පන්දමක්/පෝල්කොල ස්වල්පයක් ( කඩිප්පු කෝටු රත් කිරීම සඳහා)
- වැලි කඩදාසියක්( කඩිප්පු කොටු මැදීම සඳහා)

මේ සඳහා පහසු ඇඳුමකින් සැරසී කටයුතු කිරීම මැනවි.

රත්මල් කෝටු හෝ කිරිඳිවැල් භාවිතා කිරීමේදී රත්කර කෝටුවහි අවශ්‍ය නැමුම් සකස් කරගත හැකිය.



කඩිප්පුවේ නම්‍ය වියයුතු තැන් රත්කර ගැනීම.

වේවැල් භාවිතා කරන්නේනම් ලපටි නොවන වේවැලක් තෝරා ගත යුතුය.ඒවා රත්කිරීමට වඩා අතින්ම නවා ගැනීමේ හැකියාවක් ඇත. බෝතලයක් හෝ  රවුම් ආධාරක් අපකාරී කරගෙන මුදුව සහ නැම්ම නවා ගත යුතුය.




කඩිප්පුවක රූපයක්

ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලින් සොයා ගැනීමට නොහැකි ද්‍රව්‍යයක් වන කිරිඳිවැල් ඉතා නම්‍යශීලීතාවයක් හා සවි ශක්තියෙන් ඉහළ වන බැවින් ඒවා කඩිප්පු නිර්මාණය සඳහා යොදා ගනී. තවද විවධ වර්ගයේ කිරිඳිවැල් දක්නට ඇත. ඒ අතරින් අවශ්‍ය හොදම කිරිඳිවැල් තෝරා ගැනීම ඉතා වැදගත්ය.

කඩිප්පුවවලට අවශ්‍ය කිරිඳිවැල් කපා ගෙන එය හොඳින් සුද්ද කිරීම සිදු කරයි. ඉන් පසුව ඉටි පන්දමක් හෝ වෙනත් විවිධ ක්‍රමයන් මගින් එය රත්කර ගත යුතු අතර පසුව කෙළවරට නූලක් යොදා කඩිප්පුවේ ඇති මුදුව නිර්මාණය කළ යුතුය. මෙම මුදුව හෙවත් තෝඩු නිර්මාණයට විවධ නිර්මාණකරුවන් ඒ හා සමාන ලී මිටවල්, යකඩ බට ආදිය මුදුවේ රවුම් බව ඇති කර ගැනීම සඳහා භාවිතා කරයි. කඩිප්පුවේ මුදුව නමා ගැනීමට සහ අනෙකුත් නැමීම් ස්ථාන නමා ගැනීමට ඉටි පන්දමක් හෝ වෙනත් දාහක ප්‍රභවයක් යොදා ගත යුතු වේ. අතර ඉතා වැඩි රස්නය නිසා කඩිප්පු කොටුව විනාශ වීමට හැකියාවක් ඇති බව සැලකිය යුතු කාරණාවක් වන්නේය. තමුන් ගේ හැකියාව හා අත් දැකීම් අනුව එවැනි දේ සිදු කළ හැකිය .මෙහිදී වටහා ගත යුතු කාරණය වන්නේ මේ කිසිවක් කලබලයෙන් නොකළ යුතු බවය.ඉතා විවේකීව මෙය සිදු කළ යුතුය. පළමුව සාදන අත් දැකීම් වලදී මුදුව සකස් කර ගැනීමේදී එහි රවුම් බව ඇති නොවීමට බොහෝ ඉඩ කඩ ඇත . එහෙත් නැවත නැවත සකස් කර බැලීමෙන් මෙහි නිවැරදි බව වටහා ගත හැකිය. කඩිප්පුව නියමිත ආකාරයට නමා ගැනීමේදී ප්‍රධාන කරුණ වන්නේ විවිධ පුද්ගලයන් තම්මැට්ටම වාදනය කරනු ලබන ආකාරය අනුව කඩිප්පුවේ නැමුම් ප්‍රමාණය තීරණය කළ යුතුය. තමාටම වාදනය කිරීමට සුදුසු කඩිප්පුවක් නිර්මාණය කර ගැනීමට හැකියාවක් ඇත්නම් එය මහත් වටිනේය.

කඩිප්පුව ඒ ඒ පුද්ගලයා අනුව අවශ්‍ය දිග ප්‍රමාණය තීරණය කළ යුතුය. ඇතැම් කඩිප්පු දිගින් වැඩිවීම ද කඩිප්පුව කැඩීමට හේතුවනු ඇත. කඩිප්පුව හා අත් ස්පර්ශවන ස්ථානය හෙවත් මිට රෙදි වලින් ඔතා ගත යුතුය . ඒ සඳහා බත් හෝ ගම් ආදිය යෝදා ගනී. කඩිප්පුවේ දිග වාදකයාගේ අතෙහි වියතක් වනු ඇත. තවද කඩිප්පුවේ අල්ලන

ස්ථානය එතීමට ගම් සහ බත් වැනි ද්‍රව්‍යයන් යොදා ගනී. බත් දමා එතීමෙන් අතට පහසු වක් වනු ඇත . අතෙහි දියපට්ටා ඒමද එයින් වලකිනු ඇත.එහෙත් බත් දමා අලවා එතීමෙන් පසු හොදාන් වේලා ගත යුත බව සිහියේ තබා ගත යුතු කරුණක් වන්නේය. කඩිප්පුවේ යම් යම් ස්ථානයන් ඇද පවතින අතර, ඒවා කෙළින් කර ගත යුතුය. පසුව කඩිප්පුවේ මුදුව සිහින් වැලි කඩදාසියකින් හෝ කොරසා කොලයකින් සුමට කරගත යුතු වන්නේ කඩිප්පුවේ ගැටිති ,කැපුම් තිබීමෙන් කඩිප්පුව ස්පර්ශවන තම්මැට්ටම් ඇසෙහි සම විනාශ වී යාමට හෝ සිදුරු වීමට ඇති ඇති හැකියාව වලක්වා ගැනීමටය.

අතීතයේ පැවත එන විවධ මනංකල්පිත අදහස් හා මතයන් ද කඩිප්පු නිර්මාණය කිරීමට බලපා ඇත. කිරිදිවැල් හෝ කඩිප්පු නිර්මාණයට නැකැත් හා වේලාවන් පැවති බවට අදහස තිබුණු ද ඒවා විද්‍යානුකූල තර්ක නොවේ . එහෙත් සඳ මෝදුවන කාලයන්හි දී වෘක්ෂ ලතා කැපීමෙන් ඒවායෙහි ශක්ති සම්පන්න බව වැඩිවන බව පිළි ගත හැකි ස්වභාවධර්ම කාරණාවකි. කෙසේ වෙතත් කිරිදිවැල් තෝරාගත යුත්තේ සවි ශක්තිය හා කල්පැවැත්ම ගැන සිතා බව සැළකිය යුතු කරුණක් වන්නේය. කඩිප්පුව ඉක්මනින් විනාශවීමත් එය පිපිරීමත් වලක්වන ආකාරයට කඩිප්පුව නිර්මාණය කල යුතුය. කඩිප්පුවේ නැම්ම විවිධ පුද්ගලයන්ගේ හස්තය භාවිතා කිරීම අනුව වෙනස් වේ.

ගුණාත්මක කඩිප්පුවක් සාදා ගත් පසු එහි අලංකරණය , සිත් ඇද ගන්නා සුළු බව, පිරිසිදු බව, සවි ශක්තිය, බර ඉතා වැදගත්ය. කඩිප්පුව බර නැති වීමෙන් නියමිත අක්ෂර වල හඬ නිෂ්පත්ති නොවනු ඇත.

ඉහත සදහන් ආකාරයට වේවැල් හා රත්මල් කෝටු වලින්ද කඩිප්පු නිර්මාණය කර බැලීම තුලින් එහි අත්දැකීම තව තවත් සංවර්ධනය කර ගත හැකිය.

## දවුල් කඩිප්පුවක් නිර්මාණය .

සබරගමු සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන දවුල වාදනය කරනු ලබන්නේ කඩිප්පුව මගිනි .දවුල් වාදන අවස්ථාවලදී ආධාරකය වශයෙන් භාවිතා කරනනේ කඩිප්පුවයි. දවුල් කඩිප්පුවක් නිර්මාණය සඳහා පහත සඳහන් පූර්ව ක්‍රියා පිළිවෙල අනුගමනය කළ යුතුය.

සුදුසු ගසකින් අත්තක් හෝ මහත කෝටුවක් තෝරාගත යුතුය. මේ සඳහා ප්‍රධාන වශයෙන් යොදාගනු ලබන්නේ ඇට්ටේරියා හෝ වදමල් ගස්ය .බොහෝ විට යොදාගනු ලබන්නේ ඇට්ටේරියා ගසේ අත්තක ඒ සඳහා පහත සඳහන් කරුණු ගැන හොඳින් සැළකිලිමත් විය යුතුය.



- මෝරන ලද ශාකයක් වීම.
- වක්‍රාකාර සුළු නැම්මක් තිබීම
- ගැට හා දිරපු බවින් තොර වීම

අත්ත කපා පොත්ත හැර මද පවනේ වේලෙන්නට හරී. ඇතැම් විට පොත්ත සමග  වෙලීමටද  ඉඩ හරී.ඉතා සියුම්ව කැපෙන පිහියකින් පොත්ත සමග ඇති කොටස ඉවත් කර කඩිප්පුව හැඩය නිර්මාණය  කර ගනී.  කඩිප්පුව අග කොටස විවිධ කැටයමකින් අලංකාර කරනු ලැබේ .දවුල් කඩිප්පුවේ අල්ලන කොටස ගම් හෝ බත් ඇට යොදා ගනිමින් රෙදි ඔතනු ලැබේ .මෙය හුදෙක්ම කෝටුවක් පමණක් නොවීමට වග බලා ගැනීම නිර්මාණ කරුවාගේ වගකීමය.

# වෙස් මුහුණක් නිර්මාණය

වෙස් මුහුණු කලාව අතීතයේ සිට පාරම්පරික පැවත එන කලාවකි. එය වර්ථමානයේ විවිධ මට්ටමේ පවතී. මෙම පාරම්පරික උරුමය රැක ගැනීම උදෙසා විවිධ ආයතන මට්ටමේ විවිධ වැඩ සටහන් නිර්මාණය කරන අතර ඇතැමෙක් එයට විරුද්ධව නොයෙක් ආකාරයේ මත පළ කරති . මෙම කෘතියෙන් බලා පොරොත්තුවනුයේ විවෙකීව ජීවිතය ගත කරන කෙනෙකුට හෝ නිර්මාණ ශක්තිය වර්ධනය කරන්නෙකුට ස්වයං වෙස් මුහුණක් නිර්මාණයකට මාර්ගය පෙන්වාදීමයි.

අතීතයේ වෙස් මුහුණු නිර්මාණය සදහා යොදාගනු ලැබුවේ වෙල් කඳුරු, රුක් අත්තන වැනී සැහැල්ලු ලී වර්ගය. වෙල් කඳුරු ලි ගනු ලබන්නේ දර්ස කාලයක් ජලයට ඔරොත්තු දීමේ හැකියාවක් ඇති බැවිනි. මුහුණ නිර්මාණය කිරීමේදී කැපීමේ පහසුව ද එම ලී වර්ග වලට ඇත. රුක් අත්තන ලීය ද වෙස් මුහුණු කැපීමට ගනු ලබන්නේ සැහැල්ලු බව නිසාය.

වෙස් මුහුණුට අවශ්‍ය කොටයක් කපනු ලබන්නේ ද එම ගස ඒ සදහා සුදුසු නම් පමණි. අතීතයේදී ගස් කපා කොටස් කර පදම් කිරීමක් සිදු කරනු ලබයි . ඒ ගුල්ලන්ගෙන් කෘමි සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සදහාය . එහෙත් වර්ථමානයේ ඒ සදහා විවිධ තාක්ෂණික ක්‍රම වේදයන් භාවිතා කරයි.

කෙසේ වෙතත් මෙම පොතෙන් වෙස් මුහුණු නිර්මාණය කරන්නෙකුට එය අත්හදා බැලීමට මාර්ගයක්, අත්වැලක් සපයනු ඇත.

## පූර්ව ක්‍රියා පිළවෙල

- සුභ හෝරාවක් බලා සුදුසු ගසක්, ලී කොටයක් තීරණය කිරීම.(මේ සදහා ඇද,ගැට නැති ලී කොටයක් විය යුතුය.)

ඇද සහ ගැට ඇති තෝරා ගැනීමෙන් වෙස් මුහුණෙහි නියමිත හැඩය ගැනීමට නොහැකි වේ.

- ලී කොටය ජලය සිදීයාමට මඳ පවනේ තැබීම.

ජලය රඳා පැවතීමෙන් ලීය වේලෙද්දී නියමිත හැඩය වීකෘති වනු ඇත.

- මඩ හෝ පල් ජලයේ ඔබා තැබීම.

කෘමි සතුනගේන් වන හානිය සහ ලීයේ පැවැත්ම තීරණය වේ.

- මුහුණුට අවශ්‍යා ප්‍රමාණයට ලී කොටය කපා ගැනීම (මෙහි උඩ සහ පහළ කොටස් පොලොවට හෝ මේසයකට සමානව ඇද නැතුව කපා ගැනීම.
- ලී කොටයෙහි පොත්ත ඉවත් කර සුද්ධ කර ගැනීම.
- ගැලපෙන නියන් වර්ග මුවහත් කර ගැනීම.
- අත කොළුවක් වැනි අධාරකයක් තෝරා ගැනීම.
- සවිමත් මේසයක්,බිමක්,අධාරකයක් තෝරාගැනීම.
- නිර්මාණය කිරීමේදී නිර්මාණකරුවාට පහසු අසුනක් සුදාකම් කර ගැනීම.




## වෙස් මුහුණ කැපීම පිළිවෙල .

- තමා විසින් නිර්මාණය කිරීමට බලා පොරොත්තුවන මුහුණක ආකෘතියක් හෝ අනුහුරුවක් තෝරා ගත යුතු අතර, එහිදී පළමුවෙන්ම නිර්මාණයට ප්‍රවේශ වන්නෙක් නම් ආධුනිකයාට එය ඉතා පහසුවේ. තම නිර්මාණය කළ හැකි මුහුණක ආකෘතියක් තෝරා ගැනීම ඉතා වැදගත්ය. සරල හැඩ සහ රේඛා සහිත එකක් වීම ඊට සුදුසුය.
- තෝරාගත් කොටය සමමිතිකව බෙදෙන ආකාරයෙන් ලකුණු කර ගත යුතය. උස දෙකට බෙදන්න. ඉන්පසුව බෙදාගත් ඉහල කොටස හිසෙහි නිර්මාණයට තබා .බෙදාගත් පහල කොටස්

නැවත දෙකට බෙදා එම බෙදාගත් කොටසෙහි ඉහළ කොටස ඇස් සහ නාසය කැපීමට ඉඩ තබන්න. ඉතිරි කොටස් නැවත දෙකට බෙදා එහි ඉහල කොටස මුඛය, දත් නිර්මාණයට ඉඩ හරින්න. පහළම කොටස් නිකට නිර්මාණයට ඉඩ තබන්න.

- මුලින්ම සුදුසු ස්ථානයක කොටය තබා ගත යුතුය. එය දඬු අඬුවකට සිර කර ගැනීම , දෙපසට කොටයක් සිර කර තැබීම හෝ කකුල් දෙකට කොටය සිර කර ගැනීම කල යුතු වන්නේ කොටය එහා මෙහා යාමෙන් නිර්මාණය අපහසු තාවය මග හරවා ගැනීමය. එය තමුන්ට පහසු ක්‍රම වේදයක් භාවිතා කල යුතුය. කෙසේ වෙතත් කොටය සෙලවීම වලක්වා ගැනීමට සුදුසු ක්‍රමයක් සාදි ගැනීම සිදු කළ යුතුය.
- තෝරාගත් වෙස් මුහුණෙහි ඇති විශේෂ කොටස් නියන මගින් සකස් කළ යුතු අතර, වඩාත් මතුපිටට දිස්වෙන නාසය, නළළ, කණ්, පළමුවෙන්ම කපා ගත යුතුය. අනතුරුව ඇස්,කට, දත් යනාදිය ද කපා ගැනීමට වග බලා ගත යුතුය. තේරුම් ගත යුතු කාරණය වන්නේ වෙස් මුහුණක් කැපිය යුත්තේ මතු පිටට පෙනෙන පරිදි උස් ස්ථානයේ සිට පහත් ස්ථානයන් කරා සෙමෙන් සෙමෙන් කැපිය යුතු බවමය.
- කපාගත් වෙස් මුහුණ වැලි කඩදාසියකින් හෝ සුදුසු ද්‍රව්‍යකින් මට සිළුටු කර ගැනීම වැදගත්ය.
- ඉන්පසු සුදු වර්ණය භාවිතා කර මුහුණට උරා ගැනීමට ඉඩ සැලැස්වීම.
- අදාල මුහුණට ගැලපෙන වර්ණ හැඩ තල ගැන්වීම . මෙහිදී එක් එක් වර්ණයක් වේලෙන්නට ඉඩ සලස්වා වර්ණ ගැන්වීම සිදු කිරීම.
- මුහුණට අදාල ඇස්,ඇහිබැම යනාදි කොටස් අවසානයේ වර්ණ ගැන්වීම ඉතා සුදුසුය.

වෙස් මුහුණක් නිර්මාණය කිරීමේ දී නැවත නැවත සිදුකර එම අත්දැකීම් ලබා ගැනීමෙන් වඩාත් පලදායී නිර්මාණයක් සාර්ථක කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත



## පොත ගැන යමක්......

සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයෙහි පංති සාමාර්ථයක් සහ නර්තනය පිළිබඳ ගෞරව උපාධියක් ලැබ, කොළඹ විශ්ව විද්‍යාලයෙහි අධ්‍යාපනපති උපාධිලත් , නර්තනය සම්බන්ධයෙන් රාජ්‍ය සම්මානයට පාත්‍ර වූ යූ.කේ මහීපාල උක්වත්ත මහතා නිර්මාණ නර්තනයට සහ සාම්ප්‍රදායික නර්තන කලාවට දැඩි කැමැත්තක් දැක්වූවෙකි. ගුරුවරයෙක් වශයෙන් වසර ගණනාවක අත්දැකීම් ඇති මෙතුමා අතීතය ,වර්ථමානය හා අනාගතෙ නර්තන කලාව දිශානති පිළිබඳ ඉතා හොඳින් අධ්‍යයනයට ලක් කල පුද්ගලයෙක් බව සඳහන් කරන්නෙමි. සමස්ත ලංකා නර්තන තරඟ වලදී ජයග්‍රහණ රාශියක් ලබා ගත් මෙතුමා වර්ථමානයෙහි අධ්‍යාපන අමාත්‍යාංශයෙහි නර්තනය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරක් දරමින් පාසල් පද්ධතිය තුළ නර්තන විෂයෙහි ගුණාත්මක සංවර්ධනය කෙරෙහි දැඩි කැපවීමක් කරන බව නොරහසකි. නර්තන කලාව හා බැඳි වෘත්තික ප්‍රවේශ තමා විසින්ම හොඳින් අධ්‍යයනය කර කවෙරෙකුට හෝ ඉතා සරලව එම ප්‍රවේශයන් ඉගෙන ගැනීමට අත්වැලක් සපයා තිබීම මෙම කෘතියෙන් ඉතා පැහැදිළිය.

විශේෂයෙන් විශ්ව විද්‍යාලයක පවා විෂයය නිර්දේශයන්ට හසු නොවූ , අප රටේ කාලීන අවශ්‍යතාවයන්ට අවශ්‍යම වූ ප්‍රවේශයන් පිළිබඳව හොඳින් අධ්‍යයනය කිරීමෙන් මෙම කෘතිය ලියා ඇති බව සත්‍යයකි. වර්ථමානයේ බොහෝ දෙනා මංගල පෝරු චාරිත්‍ර ඉගෙන ගැනීමට කැමැත්තෙන් සිටී. දිවයිනෙහි ප්‍රාදේශීය වශයෙන් පෝරු චාරිත්‍ර ශිල්පීන් ප්‍රමාණාත්මකව

සිටියද, ගුණාත්මකව එකී ශිල්පීන් ඉතා අල්පය.වාණිජමය තත්වයන් යටතේ ඒවායෙහි ගුණාත්මක බව නැති අවස්ථා ද තිබෙන බව පිළිගත යුතු කරුණකි. එහි ක්‍රියා පිළිවෙල පිළිබඳව මනා අධ්‍යයනයකින් පසුව මෙම පොතෙහි ඇතුලත් කර තිබීම සතුටට කරුණකි..

පාසල් හැර යන දරුවන්ට සහ ඒ සඳහා කැමැත්තක් දක්වන කවෙරෙකුට වුවද මෙම පොත පරිශීලනය කිරීමෙන් ලබා ගත හැකි අත්දැකීම් ඉතා වටිනේය. තවද වෙස් මංගල්‍ය හා බැඳි චාරිත්‍ර , සරලව කඩිප්පුවක් සකස් කිරීම , වෙස්මුහුණක් නිර්මාණයට අවශ්‍ය මූලික අත්දැකීම් යනාදිය ඉතා සරලව පෙන්වා දී ඇත. ඒ සඳහා උනන්දුවක් දක්වන්නෙකුට ස්වයං අත්දැකීම් ලබා ගැනීමට මෙම කෘතිය උපකාරීවන බව පැහැදිළිය.

පාසල් පද්ධතියෙහි පුස්තකාලයක මෙන්ම,සංස්කෘතික ආයතනයක මෙම කෘතිය තිබීමෙන් අප රටටම ආවේණිකවූ සංස්කෘතික උරුමයන්හි අත්දැකීම් ලබා ගැනීමටත් ,ඒ තුළින් නිර්මානකරණයට පුද්ගලයන් බිහිවීම සිදුවීමත් වැලැක්විය නොහැක .එක් කණ්ඩායමකට සීමා මායාම් පනවා තිබූ මෙවැනි අත්දැකීම් ලබා දීම කාලෝචිත වූවක් බව මගේ විශ්වාසයයි. එබැවින් මෙවැනි කෘතියක් නිර්මාණය කිරීමට හැකියාව ලැබීම පිළිබඳව අතිශයෙන්ම සතුටට පත්වන අතර මහීපාල උක්වත්ත මහතා විසින් මෙවනි කෘති තව තවත් බිහි කිරීමට දායකත්වයක් ලබා දේවායැයි ප්‍රාර්ථනා කරන්නෙමි.

**ආචාර්ය පාලිකා සමන්ති**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය.